ත්‍රෛමාසික මෙහෙවරක අන්තර්ජාල ප්‍රකාශය

දීපාලිය

2023 අප්‍රේල් - ජූනි "මංගල කලාපය"



බිල්ල ඇලල - ජායාරූපය
ඉදුනිල් සෙනෙවිරත්න
(ආර්ථික සංවර්ධන නිලධාරී)

නිදහස් අධ්‍යාපනයේ ණය අපි මේ රටට ගෙවන්න ඕනෑ - 02/03

Hiking යන්න කියාපු තැන - 06

මේ අපේ මෙහෙවරයි - 07/08/09

මුඩුබිමක් ගොවිපළක් කළ සමෘද්ධිලාභියෝ - 10

ඔබගේ කාර්යයන් සරල කර ගැනීම සඳහා - 11

AI මෙවලම් සහ අනාගතය - 13

උඩරට වැනසූ සබරගමුවේ මැණික්කඩවර බලකොටුව - 16

වරකාපොල ප්‍රාදේශීය මහලේකම් කාර්යාලීය ප්‍රකාශනයකි

ත්‍රෛමාසික බෙහෙවරට "ප්‍රාණ" සුදානම්...

රජයේ දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ නියෝජනය කරමින් ඒවායෙහි සියලුම කටයුතු ගමට ගෙන යන බිම් මට්ටමේ පරිපාලන ඒකකය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යි. මහජනතාවට සේවා සපයමින් සංවර්ධන කටයුතු මෙහෙයවීම හා සම්බන්ධීකරණය එහි වගකීම වේ. පුද්ගලයකුගේ උපතේ සිට මරණය දක්වා සියලුම කටයුතු සිදු කෙරෙන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහාය.

වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සුවිශේෂී කාර්යභාරයන් සහ සුබසාධන සේවා රැසක් සිදු කෙරෙයි. ඉදිරියේදී ත්‍රෛමාසිකව පළ වන 'ප්‍රාණ' අන්තර්ජාල සඟරාවෙන් ඒ කටයුතු පිළිබඳ වරකාපොල කොට්ඨාසයේ ජනතාව දැනුවත් කරමින් අප හා ඔවුනොවුන් අතර දුරස්ථබාවය සීමා කර මහජන හිතෛෂී රාජ්‍ය සේවය තහවුරු කිරීම අරමුණ වේ. කාර්යාලයේ නිලධාරීන්ගේ රාජකාරී පීඩනය අවම කර රසඥතාවය ඇති කරමින් ඔවුන්ගේ නිර්මාණශීලී හැකියාවන්ට ඉඩහසර ලබා දීම ඒ අතරය . එහිදී සිය රාජකාරියට එහා ගිය මනුෂ්‍යත්වයෙන් සේවය කරන අප නිලධාරීන් ඇගයීම ද වේ. කාර්යාලයේ සියලුම අංශවල නිලධාරීන් අතර සාමූහික සහයෝගීත්වයක් ඇති කරමින් ඔවුන්ගේ අනෙන්‍යන්‍ය අදහස් සන්නිවේදනයට මේ උත්සාහය දායක වනු ඇතැයි මම උදක්ම විශ්වාස කරමි.

රංගන සංජීව - ප්‍රාදේශීය ලේකම්
වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

"අලුත් ගමක් - අලුත් රටක්"

උප්පැන්න විවාහ මරණ සහතික ලියාපදිංචිකිරීමේ විශේෂ ජංගම සේවය ආරම්භ

එදා ජුනි මස 20 වැනිදාය. අපේ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයට අපූරු දිනයකි. කාර්යාලයේ ශ්‍රවනාගාරය අලංකාර වූයේ මංගල සිරියෙනි. ඒ වරකාපොල කොට්ඨාසයේ අඹුසැමියන් ලෙස ජීවත් වූ යුවළ එකොළහක් නීත්‍යානුකූලව විවාහ වීමයි. එදින විවාහ වූ වයස් ගතම යුවළ වූයේ හැත්තෑ නව හැවිදිරි හා හැත්තෑ එක් හැවිදිරි විසේ පසු වූ යුවළකි. ලාබාලම යුවළ පසු වූයේ විසි හැවිදිරි විසේ පසුවන එක් දරු මාපිය යුවළකි. ප්‍රාදේශීය ලේකම්තුමා ඇතුළු මාණ්ඩලික නිලධාරීන් හා කැගල්ල දිස්ත්‍රික් සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්, අතිරේක දිස්ත්‍රික් රෙජිස්ටාර් මෙන්ම කොට්ඨාසයේ සියලුම ග්‍රාමීය රෙජිස්ටාර්වරුන් සහභාගි විය. මේ අපූරු විවාහ මංගල උත්සවය සංවිධානය කර ඇත්තේ "අලුත් ගමක් අලුත් රටක්" ජාතික ඒකාබද්ධතා සහභාගීත්වය සංවර්ධන වැඩසටහන යටතේ උප්පැන්න විවාහ හා මරණ සහතික නොමැති අයහට එම ලේඛන ලබා දීම සඳහා අපේ රෙජිස්ටාර් අංශයේ නිලධාරීන් විසිනි. එහිදී වරකාපොල කොට්ඨාසයේ වසම් 78 ම ආවරණය වන පරිදි පැවැත් වූ ජංගම සේවාවලදී හඳුනාගත් පුද්ගලයින් හට උප්පැන්න සහතිකද අනුමාන වයස් සහතික බෙදා දෙමින් ලියාපදිංචි නොවූ මරණ සඳහා සහතිකද ලියාපදිංචි කෙරිය.

සංස්කාරක

කෑගල්ල දිස්ත්‍රික් ලේකම් ජේ එම් රංජිත ප්‍රේමනාත් පියසිංහ

නිදහස් අධ්‍යාපනයේ ණය අපි මේ රටට ගෙවන්න ඕනෑ

"රාජ්‍ය සේවය කියනතේ මහජනතාවට සේවය කිරීම.ගුරුවරයෙක වුණත වෛද්‍යවරයෙක වුණත ප්‍රාදේශිය ලෙකම්වරයෙක වුණත කරන්නේ සේවයක.එහෙම සේවයක් කරන්න හැමෝටම අවස්ථාවක් නැහැ. අවස්ථාව ලැබෙන්නෙත් පෙර පින්නකට කිව්වොත් හරි. ඒ පින තව වැඩි කරගන්න පුලුවන් මහජනතාවට අපි හරි සේවයක් ලබා දුන්නොත්. ඒ වගේම රාජ්‍ය සේවයේ අපි හැමෝම නිදහස් අධ්‍යාපනයෙන් ඕහිවුණු අය. අපට වගකීමක් තියෙනවා පෙරළා ජනතාවට සේවය කිරීමට..."

හැමතිස්සෙම උත්සාහ කරන්නේ මා ළඟට එන පුද්ගලයාව සතුටින් යවන්නයි

දිසාවකට අධිපති දිසාපති ය. ඔහු කෑගල්ල දිස්ත්‍රික්කයේ පත්මත් දිසාපතිය. කුරුණෑගල ඉණ්ඩාර කොස්වත්ත කටගමුව ග්‍රාමයේ ජේ. එම්. ජයසිංහ නා ජී.ඒ. නන්දාවතී යන ගොවි මව්පිය යුවළට දාව උපත ලැබූ ඔහු දරුවන් සිවුදෙනකුගේ පවුලේ කුත්තැනියාය. ගමේ පාසලෙන් පාසල් අධ්‍යාපනය ලැබූ ඔහු 1994 දී පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව විශේෂ උපාධිය ලබා ගනු ලැබිණි. පසුව ජපානයේ **National gradute institute for policy studies** ආයතනයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියද කැළණිය විශ්ව විද්‍යාලයෙන් සමාජ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය සහ රජරට විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය හිමි කරගෙන සිටී. තවත් විෂයන් කිහිපයක් යටතේ ඩිප්ලෝමා රැසක් හිමිකරගෙන ඇත. ඔහුගේ ආදරණීය බිරිඳ කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරිනියක වන දිප්ති රෝමිනී වෙරගල යි. දිනුදි සතුරා ජයසිංහ ඔහුගේ සෙනෙහබර දියණියයි. ඔහු අද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියකු වන කෑගල්ල දිස්ත්‍රික් ලේකම් ජේ.එම්.ආර්.පී. ජයසිංහ මහතායි.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ඔහු මෙතෙක් දැරූ තනතුරු

- 1998 සහකාර ප්‍රාදේශීය ලේකම්(පලාගල)
- ප්‍රාදේශීය ලේකම් (පඳුලුගස්වැව)
- ප්‍රජා ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ
- ප්‍රාදේශීය අධ්‍යක්ෂ(අනුරාධපුර)
- වයඹ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහකාර ලේකම්
- කුරුණෑගල මහනගර සභාවේ නියෝජ්‍ය නාගරික කොමසාරිස්
- කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ(වයඹ)
- පළාත් ඉඩම් කොමසාරිස්(වයඹ)
- පළාත් පාලන කොමසාරිස් (වයඹ)
- රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
- සභා ලේකම් උතුරු මැද පළාත
- උතුරු මැද පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්
- උතුරුමැද පළාත් වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම්
- 2023 දිස්ත්‍රික් ලේකම්(කෑගල්ල)

ඔබ අද කෑගල්ල දිස්ත්‍රික් ලේකම්. මේ දක්වා පැමිණි ගමන් මග මතක් කළොත්?

මම පාසල් ගියේ කටුමුරුව කණිෂ්ඨ විද්‍යාලයට. ඒ පාසලේ හිටියේ ළමයි දෙසීයකටත් වඩා අඩු ප්‍රමාණයක්. සාමාන්‍ය පෙළ දක්වා ඉගෙන ගත්තේ ඒ පාසලෙන්. උසස් පෙළ කරන්න කටුපොත කිස්ස මහා විද්‍යාලයට ඇතුල් වුනා. උසස්පෙළ කලා අංශයෙන් මම පේරාදෙණිය විශ්ව විද්‍යාලයට ඇතුල් වෙලා ආර්ථික විද්‍යාව විශේෂවේදී උපාධිය ලබා ගත්තා. මුලින්ම මම රාජ්‍ය සේවයට එකතු වුණේ ගුරුවරයෙක් විදියට. පසුව සංවර්ධන නිලධාරියෙක් ලෙස සේවය කලා. 1998 දී තමයි ශ්‍රී ලංකා පරිපාලන සේවා විවෘත තරග විභාගයෙන් සමත් වෙලා පරිපාලන සේවයට එකතු වුණේ. ඒ සහකාර ප්‍රාදේශීය ලේකම් වරයෙක් විදියට. විසි පස් වසරක් රාජ්‍ය සේවයේ විවිධ පරිපාලන තනතුරු දරලා අද මම කෑගල්ල දිස්ත්‍රික් ලේකම් තනතුර දරනවා.

ඔබ විවිධ පරිපාලන තනතුරු දරුවත් දිස්ත්‍රික් ලේකම් ධුරයට පත් වෙන්නේ ප්‍රථම වතාවට. මේ තනතුර ඔබ කොහොමද හඳුනගෙන තිබෙන්නේ?

මෙය විශාල වගකීමක් තිබෙනතනතුරක්. ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා මහජනතාවගේ අවශ්‍යතා හා සුභසාධන සේවා ඉටු කිරීම සිදු කරනවා. රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන ආයතන සමග රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට සහය දීම සහ ඊට අවශ්‍යය වටපිටාව සකස්කර දීම සිදු කරනවා.

කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රධාන පරිපාලන නිලධාරියා විදියට ඔබේ බල ප්‍රදේශය දකින්නේ කොහොමද?

මේ කෑගල්ල දිස්ත්‍රික් ලේකම් තනතුර භාර ගෙන නවම මාස දෙකයි. ඇත්තටම මම මේ තනතුරට වගේම පළාතටත් අලුත්. මම රාජකාරී කරලා තියෙන්නේ උතුරු මැද , වයඹ, බස්නාහිර පළාත්වල. බොහෝ වෙලාවට ජීවත් වෙන පරිසරයත් එක්ක මිනිස්සුන්ගේ ආකල්ප හා හැසිරීම වෙනස් වෙනවා. මම මීට පෙර රාජකාරී කරපු වටපිටාව එක්ක ගත්තාම කෑගල්ල තියන්නේ සෞම්‍ය පරිසරයක් තියෙන ප්‍රදේශයක්.

සිය බිරිඳ සහ දියණිය සමග

2023 වසර අවසන් වෙන විට කැගල්ල දිස්ත්‍රික්කය මොහොතකින් ඉලක්කයක් කරාද ගෙනියන්න උත්සාහ කරන්නේ?

රටක් විදියට අද අපි ආර්ථික පසුබෑමකට ලක් වෙලා තියෙන්නේ. මේ තත්ත්වයට ජනතාව මුහුණ දෙන්නේ අපහසුවෙන්. කෘෂිකර්මාන්තය පැත්තෙන් ගත්තොත් කැගල්ල දිස්ත්‍රික්කයේ වී නිෂ්පාදනය අනෙක් දිස්ත්‍රික්කවලට වඩා අඩුයි. හේ රබර් වගේ අපනයන බෝග තමයි තියෙන්නේ. මිනිස්සුන්ගේ ආර්ථිකය කේන්ද්‍රීකරණය වෙලා තියෙන්නේ. ඒ නිසා මේ ආර්ථික අපහසුතා නිර්මාණය වෙලා තියෙනවා. ඒ වගේම සමහර ක්ෂේත්‍රයේ ඉන්න නිලධාරීන් නොයෙකුත් හේතු නිසා කටයුතු අතපසු කරනවා. එවැනි අය උනන්දු කරලා ගන්න විවිධ ක්‍රම අනුගමනය කරන්න වෙනවා. ඇත්තටම තමන් සමඟ සේවය කරන කාර්ය මණ්ඩලයට හොඳ පිළිගැනීමක් ලබා දීලා උනන්දුව වැඩ කළාම රාජකාරී කටයුතු හොඳින් කරන්න පුළුවන්. ඒත් එක්ක වැඩ කරපු අය සමහර කාර්යන්වලදී දිවා රෑ නොබලා තමන්ගේ පුද්ගලික කටයුතු අමතක කරලු ඉහාම ඉහළ කැපවීමකින් කටයුතු කරලා තියෙනවා.

ගොවි පවුලක ඉපදිලා මේ වගේ තනතුරුවලින් ඉදිරියට එද්දි ඔබට අභියෝග වුණේ මොනවාද?

ශ්‍රීලංකා පරිපාලන සේවයට පත්වෙලා පුහුණුව අවසන් වුණාට පස්සේ අපට සේවය කරන්න කැමැති ක්ෂේත්‍ර හඳුනාගන්න ඉඩ දුන්නා. එහිදී මම කැමැති වුණේ සහකාර ප්‍රාදේශීය ලේකම්වරයකු ලෙස කටයුතු කරන්නයි. ඒ අවස්ථාව ලැබුණා. හැබැයි අනුරාධපුර දිස්ත්‍රික්කයේ අසිදුක්කර ලෙස ගෑසට් කරලා තිබුණට ප්‍රාදේශීය කොට්ඨාස දෙකකින් එකකට තමයි පත්වීම ලැබුණේ.දුෂ්කර නිසා සමහර නිලධාරීන් එන්න කැමැති නැහැ. මට අවුරුදු 7 ක් විතර ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉන්න වුණා. ඒ කාලේ මම වෙනත් තනතුරු කිහිපයකට ඉල්ලුම් කළත් ලැබුණේ නැහැ. අපේ කණ්ඩායමේ අනුරාධපුරයට ගිය අයගෙන් මුලින්ම ප්‍රාදේශීය ලේකම් තනතුරක් ලැබුණේ මට. ඒ දුෂ්කර ප්‍රදේශවල නිලධාරීන් එන්න අකමැති නිසා වෙන්න ඇති. ප්‍රජා ජල ව්‍යාපෘතියේ ප්‍රාදේශීය අධ්‍යක්ෂ තනතුරට නේරී පත් වුණත් මාව ප්‍රාදේශීය ලේකම් තනතුරින් නිදහස් කළේ නැහැ. එකට වැඩ කරන කොට අඳුනන අයගෙන් උදව් ලැබීමේ භාග්‍යය මට හිමි වෙලා තියෙනවා. එහෙම ලැබුණු උදව්වකින් තමයි ප්‍රාදේශීය ලේකම් තනතුරින් නිදහස් වෙන්න පුළුවන් වුණේ. ඒ වගේම වයඹ පළාතේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ අය වැඩියි. ඒ නිසා වයඹ පළාතට මම යනකොට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමු ශ්‍රේණියේ අයෙක් වුණත් අවුරුදු කිහිපයක් කුන්වහ පංතියේ තනතුරුවල සේවය කරන්න වුණා. ඒත් මම ඒ තනතුරුවල සතුටින් රාජකාරී කළා.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙක් වන ඔබ රාජ්‍ය සේවයේ අත්දකීම් බහුල ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක්. රාජ්‍ය සේවයට එකතු වෙලා ඉන්න නවක නිලධාරීන්ට ඔබට කියන්න තියෙන්නේ මොනවාද?

රාජ්‍ය සේවය කියන්නේ මහජනතාවට සේවය කිරීම. ගුරුවරයෙක් වුණත් වෛද්‍යවරයෙක් වුනත් ප්‍රාදේශීය ලේකම්වරයෙක් වුනත් කරන්නේ ජනතාවට සේවයක්. එහෙම සේවයක් කරන්න හැමෝටම අවස්ථාවක් නැහැ. අවස්ථාව ලැබෙන්නෙත් පෙර පින්කට කිව්වොත් නරි. ඒ පින තව වැඩි කරගන්න පුළුවන් මහජනතාවට අපි හරි සේවයක් ලබා දුන්නොත්. ඒ වගේම රාජ්‍ය සේවයේ අපි හැමෝම නිදහස් අධ්‍යාපනයෙන් බිහිවුණු අය. අපට වගකීමක් තියෙනවා පෙරළා ජනතාවට සේවය කිරීමට. ඇත්තටම අපි ළඟට සේවයක් බලාපොරොත්තුවෙන් එන ජනතාවට සියයට සීයක්ම සේවය දෙන්න බැරි වෙන්න පුළුවන්. ඒත් කාරණා දැන අවබෝධ කරලා නාස්තිමත් මනසකින් ආපසුයවන්න පුළුවන් නම් මිට වඩා රාජ්‍ය නිලධාරීන්ට ජනතාවගේ ප්‍රසාදය දිනාගන්න පුළුවන් කියලා මම හිතන්නේ.

සංස්කාරක

Sky is the limit

It's not hard to dream we wish
Funny! How far we dream how rapid and vivid!
Yet it seems not reachable
Open your eyes,see it's capable
Use your mind the power is endless
With all your effort work to be done
Awake in dawn for the best outcome
Never break rules and obey the laws
Try to be honest in what you do
Try your best to be punvtual too
On your mark, get set and go
Defeat is strength, indolence is weak
Opportunities everywhere, even if any threat is there

Silver line in every dark cloud
Keep your dreams shine and proud
Yes that's true where there's a way for anything
Intellect is a gift, wisdom is a privilege
Sick together as one, uniy is the utmost bond
Time is most precious
Humanity feels enormous
Empower the serenity of mind
Let your dreams to start the flight
In heavy rains and thundering storms
Make your dreams fly to the sky
If no retreatsit will fly
Touch your goal to reach the sky!

Isira ekanayaka
ADR

මම මගේ විභාගයේ සමහර විෂයන් අසමත් වුණා.
නමුත් මගේ මිතුරා ඒ සියල්ල සමත් වුණා.
අද ඔහු microsoft සමාගමේ ඉංජිනේරුවෙක්.
මම ඒ සමාගමේ හිමිකරු.

-බිල් ගේට්ස්-

සිහින යනු ඔබ නිද්දේදී දකිනදෙය නොව
ඔබට නිදාගැනීමට නොදෙන දෙයකි.

-අබ්දුල් කලාම්-

අසමත්වීම වලකන්න බෑ.
එහෙම වෙලාවට අනතුරුහවනම්
ඔබට සමාවදෙන්නත් බෑ.

-ජෝ බයිඩන්-

මිනිසුන් වර්ග දෙකක් සිටින බව මගේ පියා මට පවසා ඇත.
ඉන් එක කොට්ඨක් වැඩ කරනා අයයි.
අනෙක් කොට්ඨ ඒ සඳහා ළඟකුණු දමා ගන්නා අයයි.
මගේ පියා මට නිතර උපදෙස් දී ඇත්තේ ඉන් පළමු කොට්ඨ වී සිටින ලෙසයි.
එයට හේතුව වැඩ කරන මිනිසුන් අතරේ තරගයක් නොමැති අතර තරගයක්
ඇත්තේ වැඩ නොකර ළඟකුණු දමාගන්නා මිනිසුන් අතරේ බැවිනි.

-මහත්මා ගාන්ධි-

සාර්ථවෙන්න නම් අසාර්ථක පුද්ගලයින් කිරීමට අකමැති දේවල් කෑමෑන්තෙන් කිරීමට පුරුදුවන්න.

-ඒ.එම්.ග්‍රේ-

වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ

පැහැසර බක්මහ උදානය

ඒ අප්‍රේල් මස 22 වැනිදාය. එදින වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන්ට අපූරු දිනයකි. ඒ දවස පුරා පැවැති පැහැසර බක්මහ උදානයයි. රාජකාරී පීඩනයේ සරහැස නිවාගනිමින් කාර්යාලයේ නිලධාරීන් අතර සුහදත්වය වැඩි කිරීමට සංස්කෘතික අංශය විසින් හෙළ සංස්කෘතියට මුල් නැන දෙමින් ජවයෙන් හා විනෝදයෙන් සපිරි බක්මහ උළෙලක් සංවිධානය කිරීමයි. පවුලේ සාමාජිකයින් හා එක්ව සහභාගි වූ මේ බක්බහ උළෙල දරුවන් සඳහා විශේෂ වූ ජන ක්‍රීඩා මෙන්ම අලියාට ඇස තැබීම,කණා මුට්ටිය බිඳීම, හොඳම ඇඹීම, හොඳම හිනාව ආදී විනෝදාස්වාදී ක්‍රීඩා රැසකින් සමන්විත විය. මෙම අවස්ථාවට වරකාපොල ප්‍රාදේශීය ලේකම්, සහකාර ප්‍රාදේශීය ලේකම්තුමිය, ගණකාධිකාරීතුමිය, සහකාර අධ්‍යක්ෂතුමිය, පරිපාලන නිලධාරීතුමිය හා ක්ෂේත්‍ර නිලධාරීන් මෙන්ම කාර්යාල නිලධාරීන් සහභාගි විය.

සුන්දර හිත් එකතු කරපු විශේෂ බක්මහ උළෙල

"මේ හරිම සතුටින් ඉන්න සුන්දර මිනිස්සු පිරිසක්. ඒත් සමාජයට යන්න බැරි සමාජයේ මිනිස්සුන්ගේ වපර ඇසට ලන් වන අඟිංසක මනුෂයින් කොටසක්."

මේ අයට එකතු වෙලා පහුවුණු බක්මහ උළෙලේ අසිරිය විඳින්න ඔවුන්ට අවුරුදු ජන ක්‍රීඩාවලට සහභාගි වෙලා සතුට විනෝදය ලබා දෙන්න විශේෂ අවුරුදු උත්සවයක් සබරගමුව පළාත් පරිවාස ළමාරක්ෂණ හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ මූලික අනුග්‍රහයෙන් වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ආබාධිත ප්‍රද්ගලයින්ගේ ස්වශක්ති සංවිධානය එක්ව සංවිධානය කෙරුණි. එහිදී ඔවුන් සඳහාම සුවිශේෂී කරුණ ඉසව් පැවැත්ම වූ අතර වටිනා තෑගි ද පිරි නැමිණි. මේ අවස්ථාවට වරකාපොල ප්‍රාදේශීය ලේකම්තුමා, සහකාර ප්‍රාදේශීය ලේකම්තුමිය ඇතුළු නිලධාරීන් රැසක් සහභාගි විය.

කාටත් සතුට ගෙනා වැඩහිටියන්ගේ බක්මහ උළෙල

වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැඩහිටි මහා බක්මහ උළෙල පසුගිය අප්‍රේල් 21 වැනිදා දවස පුරා මාගේන ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගනයේදී සාර්ථක අන්දමින් නිමාවට පත්විය. වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමාජ සේවා අංශය, වැඩහිටි බල මණ්ඩලය මෙන්ම පරිවාස ළමා රක්ෂණ හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ එකමුතුවෙන් සංවිධානය වූ මේ බක්මහ උළෙල සිංහල සංස්කෘතියේ සරයන් රැසක් විඳහා දක්විය. විවිධ ජනක්‍රීඩාවලින් හා වැඩහිටියන්ගේ අපූරු නැටුම් ගැයුම්වලින් මේ බක්මහ උළෙලට එක් වී නිබුණේ අපූර්වත්වයකි. ජීවිතයේ සැඳෑ සමය ගත කරන එදා නැරඹීමට මාරුවෙන් පැමිණි වැඩහිටියන් තම අබල දුබලබව මොහොතකට අමතක කර ජනක්‍රීඩාවලට සහභාගි වූයේ නැවතත් තාරුණ්‍යයට පත් වූවාක් මෙනි. දැකින් රඟන සුරුල් හඬ වයමින් වේදිකාව මත තාරුණ්‍යය අහිඹවා යමින් අපූරු රංගනවල යෙදෙන්නට වැඩහිටියන් සමත් විය. එදා ඔවුන් ලබා ගත් චිත්තෝත්තය වසරක් පුරාවට ඔවුන්ගේ සැදෑ කාලය නැටුම් කරනු ඇත. මෙම අවස්ථාවට ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී උදයකාන්ත ගුණසිලක, වරකාපොල ප්‍රාදේශීය ලේකම්තුමා හා සහකාර ප්‍රාදේශීය ලේකම්තුමිය සහභාගි විය.

එන්න යන්න අපිත් එක්ක
ඇල්ගම ඇල්ල
සිරි බලන්න....

ස්වාභාව ධර්මයා එක්ක අලුත් ආරෙකට ගනුදෙනුකරන්න මිහිඳිනු දරන වියමන් යුතු ප්‍රවණතාවයක් වෙලා. ගහකොළ, සතා සිවුපාවා එක්ක අලුත් හෘදයාංගම හඳුනාගන්න අද අපි ගොඩාක් වෙලාවට උත්සහ කරනවා. එහෙම කෙනෙකි ඔබට මහඟකාන්ත පරිසරයක වෙහෙසීම් ආස්වාදනීයක් ලබන්න යන්න මෙන්න අපූරු තැනක්. අපි කතා කරන්න හදන්නේ ලංකාවේ සුන්දරම දිය ඇලි රාජිනියන්ගෙන් එක්කෙනෙක් ගැනයි.

Hiking යන්න කියාපු තැන

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කොට්ඨාසයේ අල්ගම පුංචි නගරයේ පිහිටා තිබෙන අල්ගම ඇල්ල ගැනයි මේ කියන්නේ. කොළඹ නුවර පාරේ පස්යාල හංදියෙන් හැරිලා අත්තනගල්ල පාරේ ගිහින් නග්ගලින් හැරිලා අල්ගම පාරේ කෙළින්ම ගියොත් ඔයාලට මේ කියන තැනට යන්න පුළුවන්. නැත්නම් වරකාපොල දම්මලදෙණිය හංදියෙන් ඇත්නාවල පාරේ උඩුවක අල්ගම පාරේ යන කොටත් ඔයාට මේ කියන සුන්දර ස්ථානයට පහසුවෙන් ළඟා වෙන්න පුළුවන්. යාළුවොත් එක්ක පවුලේ අයත් එක්ක නිවාඩුවක් ගත කරන්න යන්න කියාපු තැනක්. **Camping, River Bath ,Caving** වගේ බොහෝ දේවල් ඔබට අත්විඳින්න පුළුවන් ඔන්න මෙතනට ගියොත්.

සුන්දර වටපිටාවක පිහිටලා තියෙන අල්ගම ඇල්ල අක්කර 10 ක වගේ විශාල භූමි ප්‍රදේශයක විහිදුණු ඉතා ආකර්ශනීය දිය ඇල්ලක්. බොහෝ දුර ප්‍රදේශවල ඉඳන් සංචාරකයෝ මේ දිනවල අල්ගම ඇල්ලේ අසිරිය බලන්න එන බවයි ගම්වාසීන් කියන්නේ. මෙහි විශේෂත්වය වන්නේ නෑම සඳහා ස්වාභාවයෙන්ම ගල් පරවලින් වටවුණු ස්ථාන තිබීමයි. ඒ සඳහා වඩාත් සුදුසු වන්නේ ජනවාරි පෙබරවාරි මාර්තු වගේ ජලය අඩු කාලෙටලු. දිය නෑමේදී ඇල්ලේ පහළ ප්‍රදේශය නෝරා ගන්න. දිය ඇල්ලේ ඉහළට වන්නට ගල් සහිත ප්‍රදේශයක් නිසා ටිකක් අවදානම් සහගතයි කියලා තමයි එතන හිටපු අය අපිත් එක්ක කිව්වේ.

ඒ වගේම ස්වාභාවික ගල් ගුහාවක් මේ කඳු මුදුනේ පිහිටා තියෙනවා. මිතුරු මිතුරියන් එක්ක වගේම පවුලේ අයත් එක්ක රෑයක් ගත කරන්න යන්න ලස්සනම තැනක්. රාත්‍රියට රැහැයියන්ගේ නඩ ,අහසේ සඳ තරුවල එළිය, ලන්තෑරුම් එළිය යට රාත්‍රිය පහන් කරන විට දැනෙන මිහිර ඔබත් ඇවිත් විඳගන්න. ඒ විතරක් නෙවෙයි රාත්‍රී ආහාරය උණු උණුවෙම ගල් ගුහාවෙම ලෑස්ති කරනවා කියලා තමයි ආරංචිය. මේ කෑම වේල රස විඳපු අය අපට කිව්වේ රස ගැන කියන්න වචන නෑ කියලා තමයි. බාබිකිව් දාපු චිකන් ,පොල් රොටී, කොච්චි සම්බෝල උණු උණුවෙම තේ තව කිව්වොත් කිතුල් මලෙන් පෙරෙන රා කට්ටක රස කිතුල් ගහේ යට ඉඳගෙනම බලලා වල් ඌරු මස් කෑල්ලක , තහර පිනා යන රස විඳින්න අල්ගම ඇල්ලේ නාලා මේ ගල් ගුහාවේ රාත්‍රියක් ගත කරන්න නම් ඔන්න ඔතේමයි.

සංස්කාරක

ගැබිනි මව්වරුන්ට 'උත්තම පූජා' ගී රස විඳින වැඩසටහනක්

ලෝකයක් කනත්තට ජීවිතයට ඔවදනක් තේමාවෙන් ගැබිනි මව්වරුන් උදෙසා උත්තම පූජා ගී රස විඳින්නාත්මක වැඩසටහනක් වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්තුමාගේ මූලිකත්වයෙන් පසුගියදා පැවැත්විය. ඒ සඳහා අනුග්‍රහය දරනු ලැබුවේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංස්කෘතික බල මණ්ඩලයේ කාරක සභාවේ සහික කුසුම් පැලවත්ත මහත්මිය විසිනි. ගැබිනි මව්වරුන්ට පෝෂදායී ප්‍රණීත ආහාර වේලක් මෙන්ම මනසට ගීතය සමඟ විඳින්නාත්මක හෝරාවක් නිළිණ කිරීම මෙහි අරමුණ විය. එහිදී සහභාගී වූ සියලුම ගැබිනි මව්වරුන්ට වටිනා තෑගි ප්‍රදානයක්ද සිදු කිරීම විශේෂත්වයක් විය.

ප්‍රාදේශීය ව්‍යවසායකයන්ගේ නිෂ්පාදන පොළක් වරකාපොලදී

ව්‍යවසායකයින් සඳහා විශේෂ අලෙවි අවස්ථාවක් ලබා දීමේ අරමුණින් පසුගිය අප්‍රේල් 10 හා 11 දෙදින පුරා වරකාපොල මහලේකම් කාර්යාලයේ ව්‍යවසායක සංසදය මඟින් සංවිධානය කරනු ලැබූ විශේෂ අවුරුදු පොළ හා ප්‍රාදේශීය ව්‍යවසායක අලෙවි පොළ වරකාපොල මහජන ක්‍රීඩාංගනයේදී ඉතා සාර්ථක අන්දමින් පැවැත්විය.

වරකාපොල ප්‍රාදේශීය ලේකම් හා සහකාර ප්‍රාදේශීය ලේකම්තුමියගේ උපදේශකත්වයෙන් පැවැත් වූ මෙම අවස්ථාවට ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී උදයකාන්ත ගුණසිලක මැතිතුමන් ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගී වියකාර්මික මණ්ඩලයේ අධ්‍යක්ෂතුමා ඇතුළු කාර්ය මණ්ඩලයද වරකාපොල ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයද කොමර්ලේ බැංකුව ලංකා බැංකුව හා මහජන බැංකුව නියෝජනය කරමින් පැමිණි නිලධාරීන්ද පැමිණ සිටියහ. ප්‍රාදේශීය ව්‍යවසාය සංසදයේ ව්‍යවසායකයින් හා සමෘද්ධි සංසදයේ ව්‍යවසායකයින් මෙන්ම දෙදින පුරාම ප්‍රදේශවාසීන්ගේ පැමිණීම මෙම අලෙවි පොළ සාර්ථක කරගැනීමට ඉවහල් විය.

කාන්තා දිනය සමරන්න විශේෂ වැඩසටහන් රැසක්

ජාත්‍යන්තර කාන්තා දිනය නිමිති කරගනිමින් කාන්තා සැමරුම් විශේෂ වැඩසටහනක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මාර්තු 20 වැනිදා පැවැත්විණි. එහිදී ශ්‍රී ලංකාවේ ප්‍රථම කාන්තා දිසාපතිනිය වූ රන්මැණිකේ ගුණතිලක මහත්මියට ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගී වූ කැගල්ල දිස්ත්‍රික් ලේකම් රංජන් ජයසිංහ මහතා අතින් සමරු උපහාර පිරිනැමීම විශේෂත්වයක් විය. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හොඳම ව්‍යවසායික කාන්තාවන් තෝරා සහතික පත් හා සැමරුම් තිළිණ ලබා දෙමින් ඔවුන් ඇගයීමට පත් කරමින් දිරි ගැන්වීම වරකාපොල ප්‍රාදේශීය ලේකම්තුමාගේ මූලිකත්වයෙන් සිදු විය.

එදින කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ ප්‍රසිපාදන මත වැන්දඹු හා කාන්තා ගෘහ මූලික පවුල් උදෙසා ක්‍රියාත්මක වන ණය වැඩසටහන් ව්‍යාපෘතිය යටතේ පොලී රහිත ණය මුදලක් ස්වයං රැකියා සඳහා ලබා දීම සිදු කෙරුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ආදායම් උත්පාදන මාර්ග සඳහා පෙළඹවීමේ දෙදින පුහුණු පාඨමාලාව සාර්ථකව නිමා කළ කාන්තා ව්‍යවසායිකාවන්ට සහතිකපත්‍ර එදින ලබා දුන් අතර එක්ක්‍රිය ණය වැඩසටහන යටතේ ණය ලබා ලබා ගැනීමට එය විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ. වරකාපොල සහකාර ප්‍රාදේශීය ලේකම්තුමිය එම වැඩසටහනට සහභාගී වෙමින් ඇය දයේ අභිමානයයි තේමාව යටතේ ඉතා හරවත් දේශනයක් පැවැත් වූ අතර පෙර පාසල් ගුරුවරියන්ගේ හා වරකාපොල කොට්ඨාසයේ ග්‍රාමීය කාන්තා කාර්ය සංවිධායවල සාමාජිකාවන්ගේ නාට්‍යය හා නැටුම්වලින් එම මොහොත වර්ණවත් වියඅඩු ආදායම් ලාභී කාන්තා ගෘහ මූලික පවුල් ඍසකට එදින වටිනා වියළි ආහාර ද්‍රව්‍ය මල්ලක් මහජන බැංකුවේ අනුග්‍රහයෙන් පිරි නැමිය. සියලුම සමරුපලක සහ සහතිකපත්‍ර සඳහා ලංකා බැංකුවෙන් සහ සියලුම ආහාර පාන සංග්‍රහ කටයුතු ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සාදර අනුග්‍රහයෙනි.

අඩුආදායම්ලාභී පවුල්වල දරුවන්ට පාසල් උපකරණ බෙදා දේ

වරකාපොල ප්‍රාදේශීය ලේකම්තුමාගේ මග පෙන්වීමෙන් DOZEN සමූහයේ මූලික දායකත්වයෙන් අඩුආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා ලක්ෂ 20 කට ආසන්න පාසල් උපකරණ බෙදා දීමේ වැඩසටහනක් පසුගිය පළමුවැනිදා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පැවැත්විණි. රජයේ ලියාපදිංචි පුනාය ආයතනයක් වන DOZEN සමූහය වෙනුවෙන් එහි සභාපතිතුමා ඇතුළු නිලධාරී මණ්ඩලයද ශ්‍රී ලංකා පාර්ලිමේන්තු වෙක්ඛාරී නරේන්ද්‍ර ප්‍රනාන්ද මහතා ඇතුළු කමිටු සාමාජිකයින්ද මේ අවස්ථාවට එක්ව සිටියහ. පාසල් බෑග් පොත් ඇතුළු එක් පාසල් උපකරණ කට්ටලයක වටිනාකම රු6500 ක් වන අතර වරකාපොල වකම 78 හි අඩුආදායම්ලාභී පවුල්වල දරුවන් 280 දෙනකු සඳහා මෙම පාසල් උපකරණ බෙදා දීමේ වැඩසටහන සංවිධානය කරනු ලැබුවේ සහකාර ප්‍රාදේශීය ලේකම්තුමිය ප්‍රමුඛ කාර්යමණ්ඩලයේ දායකත්වයෙනි.

කහඹිලියාව මහා විද්‍යාලයේ දරුවන්ට ලංකා බැංකුවෙන් පාසල් උපකරණ

අක්වන්න වසමේ ග්‍රාමනිලධාරී ඇතුළු නිලධාරීන්ගේ දායකත්වයෙන් පවතින ආර්ථික අර්බුද නමුත්වේ දරුවන්ට පෝෂදායී ආහාර වේලක් ලබා දීමේ අරමුණින් කහඹිලියාව මහා විද්‍යාලයේ දරුවන්ට කෑම හා ආහාර වේලක් ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කෙරුණි. එම වැඩසටහන්වල කවන් දිනුවක් ලෙසින් පාසලේ සුබ සාධන සංගමය හා එක්ව මෙම වසරේ පළමු වසරට ඇතුල් වූ දරුවන්ට පාසල් බෑග් ඇතුළු පාසල් උපකරණ කට්ටලයක් ගමේ පරිත්‍යාගශීල ජනතාවගේ හා ලංකා බැංකුවේ දායකත්වයෙන් බෙදා දුණි. එම අවස්ථාවට දැදිගම පොලිස් ස්ථානාධිපතිතුමා ඇතුළු ආරාධිත අමුත්තන් ඍසක් සහභාගී විය.

මාහේන පුංචි කැකුළු පෙර පාසලේ දරුවන්ට පෝෂදායී ආහාර වේලක්

වරකාපොල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය හා ප්‍රාදේශීය ලේක කාර්යාලයේ නිලධාරීන් එක්ව වයස අවුරුදු 5 ට අඩු දරුවන්ට පෝෂදායී ආහාරවේලක් මාහේන ජනපදයේ ඩඩිලි සේනානායකාරමයේදී ලබා දීම පසුගියදා සිදු මාහේන ජනපදයේ වෙසෙන අයිලින් මෙන්ඩිගේ මූල්‍යමය දායකත්වයෙන් පුංචි කැකුළු පෙර පාසලේ දරුවන්ට සමඟර පෝෂදායී දිවා ආහාරවේලක්ද වසමේ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් ලබා දුණි.

නාංගල්ල පල්ලියේදී බෝ නොවන රෝග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක්

අප ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් හා වරකාපොල ආයුර්වේද රෝහලේ ප්‍රජා වෛද්‍යවරුන්ගේ මූලිකත්වයෙන් පසුගියදා බෝ නොවන රෝග පිළිබඳ විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහනක් නාංගල්ල මුස්ලිම් පල්ලියේදී පැවැත්විය. එහිදී බෝ නොවන රෝග සඳහා වෛද්‍ය ප්‍රතිකාර මෙන්ම නිරෝගීමත් සොඛ්‍ය සම්පන්න ජීවිතයකට ගෙවත්තෙන් ලබා හැකි පෝෂදායී ආහාර පිළිබඳ දැනුවත් කිරීමක්ද සිදු කෙරිණි.

පස්පොලකන්ද ගෝල්ඩන් හාර්ට් හි බක්මහ උළෙල

පස්පොලකන්ද ගෝල්ඩන් හාර්ට් ක්‍රීඩා සමාජය විසින් බක්මහ උළෙලක් පසුගියදා පැවැත්විණි. රාගල්කන්ද නසින ෆර්නිචර්ස් හා පස්පොලකන්ද ගම්වාසීන්ගේ මෙන්ම වසමේ නිලධාරීන්ගේ දායකත්වයෙන් ඉතා සාර්ථක අන්දමින් පැවැත්විය.

මී අපේ මෙහෙවරක්

වේරගලින් විශේෂ රුක් රෝපණ වැඩසටහනක්

වේරගල වසමේ නිලධාරීන් හා ගමවාසීන් එක්ව විශේෂ රුක් රෝපණ වැඩසටහනක් පසුගියදා ප්‍රදේශයේ පොදු ස්ථාන කිහිපයක සිදු කෙරුණි. රට සමගාමීව ආතුමණික ගාක විනාශ කිරීමේ ශ්‍රමදාන කිහිපයක්ද ප්‍රදේශයේ ගමවාසීන් එක්ව ක්‍රියාත්මක කෙරුණි.

රෝස කැකුළු ළමා සමාජයෙන් විශේෂ බෝධි පූජාවක්

නිවුවුව රෝස කැකුළු ළමා සමාජයේ දරුවන් මව්පියන් හා වසම නිලධාරීන් එක්ව රට දයට සෙත් පතා විශේෂ බෝධි පූජාමය සිංහකෙත් නිවුවුව විහාරස්ථානයේදී පැවැත්විය.

දිලෙන තරු ළමා සමාජයේ දරුවන්ගේ චිත්‍ර තරඟයක්

12 පැණිහෙල දිලෙන තරු ළමා සමාජයේ දරුවන්ට චිත්‍ර තරඟයක් හා නැටී බෙදා දීමේ උත්සවයක් වසමේ නිලධාරීන්ගේ මූලිකත්වයෙන් පැවැත්විණි. ගමේ දරුවන්ගේ කායික මානසික හා සහයෝගිතාවය වර්ධනය කිරීම මෙහි මූලික අරමුණ විය.

ඉඹුලෝවිට ගෘහණියන්ට ස්වයං රැකියා පුහුණුව

විදානා නිලධාරීන්ගේ සම්පත් දායකත්වයෙන් ඉඹුලෝවිට වසමේ ගෘහස්ත සඟන් නිෂ්පාදන වැඩසටහනක් සාර්ථක අන්දමින් පැවැත්විය. පවතින ආර්ථික අර්බුද හමුවේ නිවසේ සඟන් පරිභෝජනයට අවශ්‍ය සඟන් නිවසේදීම සකස් කරගැනීමට හා ස්වයං රැකියාවලට ගාමිණියන් දිරිගැන්වීමේ අරමුණින් මෙය වසමේ නිලධාරීන් විසින් සංවිධානය කරන ලදී.

නිල් කටරොඩු මල් වවන්න උගන්වයි

තුල්හිරිය,පරාක්‍රමගම හා නංගල්ල වසම්වල නිලධාරීන්ගේ එකමුතුවෙන් පිහිටුවා ඇති ස්වයං රැකියා සංගමයේ සමාජිකයින්ට පසුගියදා නිල් කටරොඩු ලේ වගාව පිළිබඳ විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්විණි. මල් අලෙවි කිරීමට අවස්ථා හඳුන්වා දී ස්වයං රැකියා සඳහා ගම්වාසීන් නවත් යොමු කිරීම මෙහි අරමුණ විය.

ඉටි පන්දම් සෑදීමේ පුහුණු වැඩසටහනක්

ස්වයං රැකියා සඳහා අවස්ථා හඳුන්වා දීමේ අරමුණින් ඉටි පන්දම් සෑදීමේ පුහුණු වැඩසටහනක් විදානා සම්පත් නිලධාරීන්ගේ සම්පත් දායකත්වයෙන් හා වරකාපොල වසම නිලධාරීන්ගේ සංවිධානයෙන් පසුගියදා පිළාපුව විහාරස්ථානයේදී පැවැත්විණි.

අඩුආදායම්ලාභී පවුල්වලට වියළි ආහාර මල්ලක්

පවතින ආර්ථික අර්බුද හමුවේ ජනතාවට සහනයක් ලබා දීමේ අරමුණින් මාස් සමූහ ආයතනයේ මූල්‍ය දායකත්වයෙන් පරාක්‍රමගම අඩුආදායම්ලාභී පවුල් 15 කට වියළි ආහාර මල්ලක් වසමේ නිලධාරීන්ගේ මූලිකත්වයෙන් සිදු කෙරිණි.

දරුවන්ගේ කුසලතා සංවර්ධනයට ළමා කඳවුරක්

ගොඩවෙල, නාඹුගල, පුහුල්ගම වසම්වල සියලුම නිලධාරීන්ගේ එකමුතුවෙන් වසම්වල දරුවන්ගේ නායකත්ව සංවර්ධනය හා කුසලතා සංවර්ධනය කිරීමේ අරමුණින් ළමා කඳවුරු වැඩසටහනක් පසුගියදා පැවැත්විණි. ඒ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ළමා හිමිකම් නිලධාරී ඇතුළු නිලධාරීන් රැසක් සහභාගි විය.

ගෙවතු වගාවන්ට නොමිලේ එළවළු පැළ

ගෙවතු වගාකරුවන් දිරිගැන්වීම හා ආහාර සුරක්ෂිතභාවය ඉහළ නැංවීමේ අරමුණින් ඕපාත වසමේ නිලධාරීන්ගේ හා සමෘද්ධි සමිතියේ මූලිකත්වයෙන් එළවළු පැළ බෙදා දීම සිදු කෙරිණි.

නාඹුගල පාසලේ සිසුන්ට පෝෂණීය කොළ කැඳ

නාඹුගල වසමේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ප්‍රදානත්වයෙන් දරුවන්ගේ පෝෂණ තත්ත්ය ඉහළ නැංවීම හා පෝෂදායී ආහාර සඳහා දරුවන් යොමු කිරීමේ අරමුණින් නාඹුගල මහා විද්‍යාලයේ සිසුන් සඳහා පෝෂණීය කොළ කැඳ තෝප්පයක් ලබා දීමේ වැඩසටහනක් පසුගියදා පැවැත්විය.

සරු ගෙවත්තකට ගොවිජන සේවයෙන් උපදෙස්

කල්ගම වසමේ ගම්වාසීන්ට සාරවත් ගෙවත්තක් සකසා ගන්නා ආකාරය පිළිබඳ විශේෂ පුහුණු වැඩසටහනක් පසුගියදා ගොවිජන සේවා මධ්‍යස්ථානයේ නිලධාරීන් හා එක්ව වසමේ නිලධාරීන්ගේ මූලිකත්වයෙන් සිදු කෙරුණි.

දිලෙන තරු ළමා සමාජයෙන් ළමා නිර්මාණ ප්‍රදර්ශනයක්

මාගේන දිලෙන තරු ළමා සමාජයේ දරුවන්ගේ ළමා නිර්මාණ ප්‍රදර්ශන වැඩසටහනක් පසුගියදා පැවැත්විය. දරුවන්ගේ නිර්මාණ කුසලතා ඔප් නැංවීම හා ඒ සඳහා ඉඩ අවස්ථාව ලබා දීම මෙහි මූලික අරමුණ විය.

සිනර්ජි අවමංගල්‍යාධාර සමිතියෙන් වියළි ආහාර බෙදා දේ

අපහයනය සඳහා විසිතුරු මත්ද්‍රව්‍ය භාවිතාවන ප්‍රචලිත කිරීමේ විශේෂ වැඩසටහනක් දිස්ත්‍රික් ජලජීවී සංවර්ධන නිලධාරීන්ගේ දායකත්වයෙන් පසුගියදා පැවැත් වූ අතර අඩු ආදායම්ලාභී පවුල් සඳහා සතියකට අවශ්‍ය වියළි ආහාර ලබා දීමේ වැඩසටහනත් තුල්හිරිය වසමේ නිලධාරීන්ගේ මැදිහත්වීමෙන් සිදු කෙරිණි. වියළි ආහාර සඳහා අරලිය උයනේ සිනර්ජි අවමංගල්‍යාධාර සමිතියේ මූල්‍යමය දායකත්වයෙනි.

තෝලංගමුවේ බක් මහ උළානය

තෝලංගමුව තෝසත් ළමා සමාජය , යෞවන සමාජයේ තරුණ තරුණියන් හා ගම්වාසීන් එක්ව බක්මහ උළෙලක් ඉතා සාර්ථක අන්දමින් පැවැත්විය. දරුවන්ගේ, තරුණ ප්‍රජාවගේ හා ගම්වාසීන්ගේ සුහදත්වය එකමුතුකම සහ සහෝදරත්වය ඇති කිරීම මෙහි ප්‍රධාන අරමුණයි.

ගස්නාවේ ඩෙංගු මර්ධන වැඩසටහනක්

ගස්නාව වසමේ ඩෙංගු මර්ධන වැඩසටහනක් මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්ගේ හා වසමේ නිලධාරීන්ගේ දායකත්වයෙන් පැවැත්විය. එහිදී නිවාස පරීක්ෂා කිරීම හා මදුරු කිටයන් බෝවී ඇති ස්ථාන හඳුනාගනිමින් ජනතාව දැනුවත් කිරීම එහිදී සිදු කෙරුණි.

දෙල්ගමුව වසමට අක්ෂි සායනයක්

දෙල්ගමුව වසමේ කැනඩා විසින් දායකත්වයෙන් හා වසමේ නිලධාරීන්ගේ එකමුතුවෙන් යහපත් අක්ෂි සෞඛ්‍යයක් පවත්වාගෙන යාමේ අරමුණින් විශේෂ අක්ෂි සායනයක් පවත්වන ලදී.

කුකුල්පනේ බක්මහ උළෙල

කුකුල්පනේ වසමේ සිංහ ශක්ති යෞවන සමාජයේ හා අරුනළු ළමා සමිතිවල දරුවන්ගේ එකමුතුවෙන් බක්මහ උළෙලක් සංවිධානය කර තිබුණි.

දරුවන්ගේ සංවිධානාත්මක හැකියාව, සහයෝගය හා විනෝදය සඳහා අවස්ථාව ලබා දීම මූලික අරමුණ විය.

තඹදිය පැරකුම් යෞවන සමාජයේ බක්මහ උළෙල

තඹදිය වසමේ පැරකුම් යෞවන සමාජයෙන් බක්මහ උළෙලක් සම්වාසිත්ගේ දායකත්වයෙන් ඉතා සාර්ථක අන්දමින් පැවැත්විය. පාරම්පරික ජනක්‍රීඩාවලට මුල් තැනක් දුන් මේ බක්මහ උළෙල වසමේ නිලධාරීන්ගෙන් හා ගමේ කරුණ පිරිසගේ සංවිධානයෙන් පැවැත්විණි.

මැටියගහේ නිලධාරීන්ගෙන් දරුවන්ට පෝෂණීය සුප්

මැටියගහේ වසමේ විද්‍යාවර්ධන ප්‍රාථමික විද්‍යාලයේ දරුවන්ට පෝෂණීය සුප් වේලක් ලබා දීමේ වැඩසටහන සම්වාසීන් හා වසමේ නිලධාරීන්ගේ එකමුතුවෙන් ලබා දෙන ලදී.

ඇගල්ල වසමේ විශේෂ රුක් රෝපණ වැඩසටහනක්

ඇගල්ල වසමේ හොරේකන්ද ජල පෝෂිත රක්ෂිතයේ ජලය නවදුරටත් ආරක්ෂා තහවුරු කරගනිමින් දිරිසකාලීන ගාක ඇති කිරීම සහ මෙම භූමියේ ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමේ අරමුණින් විශේෂ රුක් රෝපණ වැඩසටහනක් වසමේ නිලධාරීන් හා බෝදාවල මරණාධාර සමිතියේ සාමාජිකයින්ගේ දායකත්වයෙන් පැවැත්විය.

මිල්කෝ ආයතනයෙන් අල්පිටිය දරුවෙකුට වටිනා පොත් පාර්සලයක්

මිල්කෝ ආයතනයට හිරි සපයන අල්පිටිය උතුර හිරිගොට සමිතියේ සාමාජිකයකුගේ දරුවකුට හිඟෙන්වය සමන්විම නිසා මිල්කෝ ආයතනය විසින් රු.15000 කට ආසන්න වටිනාකමකින් යුත් පොත් පාර්සලයක් ලබා දෙන ලදී. මේ අවස්ථාවට වසමේ නිලධාරීන් හා ග්‍රාම සංවර්ධන සමිතියේ නිලධාරීකුමිය සහභාගි විය.

කුඹල්ගම ගෙවතු වගා සංවර්ධනයට නොමිලේ එළවළු පැළ

කුඹල්ගම වසමේ ගෙවතුවගා සංවර්ධනය කරමින් තම දෛනික ආහාර අවශ්‍යතා ගෙවත්තෙන් ඉටු කර දීමේ අරමුණින් ගම්වැසියන් රැසකට එළවළු පැළ බෙදා දීම වසමේ නිලධාරීන්ගේ දායකත්වයෙන් සිදු කෙරුණි.

ලෙනගල ගොවීන්ට නොමිලේ පොල් පැළ

පහළ ලෙනගල වසමේ ගොවීන්ට පොල් පැළ 100 ක් බෙදා දීමේ වැඩසටහනක් පැවැත්විණි. එහිදී හෝතියව ලක් වූ පොල් පැළ වෙනුවට නැවත පොල් පැළ ලබා දීම හා රටේ පොල් නිෂ්පාදන ප්‍රවර්ධනයට අවස්ථාව සලසා දීම මූලික අරමුණ විය.

ඒබ්ධගල කණිෂ්ඨ විද්‍යාලයට සෙල්ලම් මිදුලක්

ඒබ්ධගල කණිෂ්ඨ විද්‍යාලයේ දරුවන්ට උක්ම 9 ට ආසන්න වටිනාකමකින් යුත් සෙල්ලම් මිදුලක් සකසාදීම විද්‍යාල්පතිතුමා ඇතුළු ගුරුමණ්ඩලය හා මව්පිත්ගේ මෙන්ම වසමේ නිලධාරීන්ගේ මූලිකත්වයෙන් සිදු කෙරුණි. ඒ සඳහා සම්පූර්ණ මූලය දායකත්වය රත්මලාන ස්කයි ගේට් ප්‍රයිවට් ලිමිටඩ් හි අධිපතිතුමාගෙනි.

සමගි කවයෙන් බිස්කට් සහ සිසිල් පැන් දන්සලක්

ශ්‍රී සම්බුද්ධ වර්ෂ 2567 ක් වූ වෙසක් පොහෝ දිනය නිමිත්තෙන් වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමගි කවය විසින් බිස්කට් සහ සිසිල් පැන් දන්සලක් කාර්යාල පරිශ්‍රය ඉදිරිපිට ප්‍රාදේශීය ලේකම්තුමා සහ සහකාර ප්‍රාදේශීය ලේකම්තුමාගේ මූලිකත්වයෙන් පැවැත්විණි.

ගොවීන්ට බුලත් වගාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක්

සොහොයුරා නිෂ්පාදන සම්මාන වැඩසටහන යටතේ උඩුවක වසමේ බුලත් වගාව සඳහා නව බීම සකස් කිරීම, බුලත් වගාවට ගොවීන් යොමු කිරීම මෙන්ම අපනයනය සඳහා බුලත් නිෂ්පාදනය කිරීම සඳහා විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහනක් වසමේ නිලධාරීන්ගේ දායකත්වයෙන් පැවැත්විණි.

ඩෙංගු මර්ධන පා ගමන

හැලියගොඩ වසමේ එකමුතු කැකුලු ළමාසමාජයේ දරුවන් ගේ සහභාගීත්වයෙන් ඩෙංගු මර්දන හා ළමා හිත්සනය පිටුදකිමු යන මැයෙන් පා ගමනක් සංවිධානය කර තිබුණි.

මුඩුබිමක් ගොවිපළක් කළ සමෘද්ධිලාභියෝ

දුප්පත්කම තුරන් කිරීමට ආධාර මානසිකත්වය වෙනුවට ඔවුන් නිෂ්පාදන ක්‍රියාවලියට දායක කර ගනිමින් වැඩි මානසිකත්වයක් ඇතිකිරීම වඩාත් ප්‍රායෝගිකය. එයට කදිම නිදසුනක් අපට දැදිගම වසමෙන් ආරංචි විය. ඒ දැදිගම රජමහා විහාරයට අයත්ව මුඩු ඉඩමක්ව පැවැති භූමියක පවත්වාගෙන යන සාමූහික ගොවිපලක අපූරු කතාවකි. අක්කර දෙක හමාරක පමණ භූමි ප්‍රමාණයක පවත්වාගෙන යන මේ ගොවිපලෙන් යැපෙන සමෘද්ධිලාභී පවුල් අටකි. පවතින ආර්ථික අර්බුද හමුවේ ඔවුන්ගේ ආර්ථිකයට සහායක් වන්නට වරකාපොල ප්‍රාදේශීය ලේකම්තුමාගේ මගපෙන්වීමෙන් වසමේ නිලධාරීන්ගේ මෙහෙයවීමෙන් ඉතා සාර්ථක අන්දමින් මේ ගොවිපළ පවත්වාගෙන යනු ලබයි. ගම්වාසීන්ට ඉතා අඩු මුදලකට තැවුම් එළවළු මේ ගොවිපළෙන් ලබා ගත හැකි අතර පෝය දිනයන්හි දැදිගම රජමහා විහාරයට පැමිණෙන බැතිමතුන්ට හා ඒ මග දෙපස ගමන් කරන මගීන්ට අලෙවි කිරීමෙන් මේ ගොවියෝ ආදායම් ලබති. මෙයින් ලබන ආදායමෙන් නව වසරේ දරුවන්ට පොත්පත් ලබා ගැනීමට, තමන්ගේ නිවාස පිළිසකර කර ගැනීමට මෙන්ම සින්නවීමට යිය තම රත් බඩු බෙරාගැනීමට යොදා ගත් බව ඔවුන් අප සමග පැවසුවේ සතුටිනි. මේ සාර්ථක සමූහ ගොවිපළ පිටුපස හදබිම අධිකාරිය නාලක සේනාධීර පදනම වරකාපොල ප්‍රාදේශීය සභාවේ උප සභාපති නිමල් රණතුංග කොරියාවේ සේවය කරන පරිනාගශීලි මහතෙකු හා කොන්ත්‍රාත් වසන්ත මහතාද සිටින බව ඔවුන් අප සමග පැවසීය.

දැදිගමට අඩු මිලට තැවුම් එළවළු සමූහ ගොවිපළෙන්

අහිංසක දරු පවුලකට හිසට සෙවණක් දෙමු

මේ පස්දරු පවුලකි. ගම 95වී කන්දේගම. මහා ධාරානිපාත වර්ෂාවකට හසුව ඔවුන්ගේ හිසට සෙවණක් දුන් පුංචි පැළ දැස් ඉදිරිපිටම කඩා වැටුණි. ස්ථිර ආදායමක් නැති ඉන්න හිටින්න තැනක් නැති මේ අහිංසක දරු පවුලට හිසට වහළක් තනා දෙන්නටයි මේ වැයම. මේ උත්සාහය පිටුපස සිටින්නේ වසමේ ග්‍රාම නිලධාරී, ආර්ථික සංවර්ධන නිලධාරී ඇතුළු වසමේ නිලධාරීන්ය. මූලික මගපෙන්වීම වරකාපොල ප්‍රාදේශීය ලේකම්තුමා හා සහකාර ප්‍රාදේශීය ලේකම්තුමියගෙනි. මේ වන විට ඉතාලියේ සේවයේ නියුතු පරිනාගශීලි මහතෙකු විසින් නිවසේ අත්තිවාරම බැඳ අවසන්ය. ඉදිරි වැඩකටයුතු සඳහා පරිනාගශීලි ඔබගේ සහාය පතයි.

ආර්ථික සංවර්ධන නිලධාරී දු.අං.0703734251

ඔබේ සහාය ඕනෑම වෙලාවයි මේ

කන්දේගම වසමේ නිලධාරීන්ගේ මූලිකත්වයෙන් තවත් අසරණ පවුලකට හිසට සෙවණක් ලබා දෙන්නටයි මේ සුදානම. මේ නිවසේ හිමිකාරිනිය චන්ද්‍රලතා මහත්මියයි. ස්ථිර ආදායමක් නැති මේ පවුලේ ජීවත් වන්නේ මව හා දියණියයි. දැඩි ආර්ථික අපහසුතා මැද ජීවත් වන මේ පවුලට නොතෙමී ආරක්ෂා සහිතව ජීවත් වන්නට නිවසක් තනා දීමේ මහඟු පුණ්‍ය කර්මයට ඔබටත් දායක විය හැකියි.

ආර්ථික සංවර්ධන නිලධාරී දු.අං.0703734251

කොටි බැහා

ඔබගේ කාර්යයන් පහසු කර ගැනීම සඳහා

මුල්වරට හැඳුනුම්පතක් ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන.

- සම්පූර්ණ කරන ලද ප්‍ර.ලි.දෙ.වි.1 ආකෘති පත්‍රය
- 35mm x 45mm ප්‍රමාණයේ වර්ණ ඡායාරූප 5 ක්
- උප්පැන්න සහතිකය මුල් පිටපත හා ඡායා පිටපතක්
- රු.35ක මුද්දර ඇලවූ ලියුම් කවරයක් (සාමාන්‍ය සේවය සඳහා පමණක්)
- A4 ප්‍රමාණයේ ලියුම් කවර 2ක් (එක් දින සේවය සඳහා පමණක්)
- වයස අවුරුදු 17 ට අඩු අයදුම්කරුවන් සඳහා රුපියල් 3.00 ක් වටිනා මුද්දර
- වයස අවුරුදු 17 ට වැඩි අයදුම්කරුවන් සඳහා රුපියල් 13.00 ක් වටිනා මුද්දර
- නම රැකියාව හැඳුනුම්පතේ සඳහන් කිරීම අවශ්‍ය වන්නේ නම රට අදාළ සේවා සහතිකය (මාස 03 ක් ඇතුළත ලබා ගත්)

හැඳුනුම්පත සංශෝධනය කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ලිපිලේඛන

- සම්පූර්ණ කරන ලද ප්‍ර.ලි.දෙ.වි.08 ආකෘති පත්‍රය
- දැනට භාවිත කරන හැඳුනුම්පත
- 35mm x 45mm ප්‍රමාණයේ වර්ණ ඡායාරූප 5 ක්
- රුපියල් 15 ක් වටිනා මුද්දර
- උප්පැන්න සහතිකය මුල් පිටපත හා ඡායා පිටපතක්
- රු. 35ක මුද්දර ඇලවූ ලියුම් කවරයක් (සාමාන්‍ය සේවය සඳහා පමණක්)
- A4 ප්‍රමාණයේ ලියුම් කවර 2ක් (එක් දින සේවය සඳහා පමණක්)
- විවාහක කාන්තාවක්, තම ස්වාමි පුරුෂයාගේ නම ඇතුළත් කිරීම සඳහා ඉල්ලා සිටී නම විවාහ සහතිකයේ මුල් පිටපත හා එහි ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතුය.
- නම රැකියාව හැඳුනුම්පතේ සඳහන් කිරීම අවශ්‍ය වන්නේ නම රට අදාළ සේවා සහතිකය ද (මාස 03 ක් ඇතුළත ලබා ගත්)

ජාතික හැඳුනුම්පතේ අනුපිටපතක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ලිපිලේඛන.

- සම්පූර්ණ කරන ලද ප්‍ර.ලි.දෙ.වි. 7 ආකෘති පත්‍රය
- හැඳුනුම්පත නැතිවූ බවට පොලිසියේ කරන ලද පැමිණිල්ලේ මුල් පිටපත (මාස 06 ක් නොඉක්මවූ)
- 35mm x 45mm ප්‍රමාණයේ වර්ණ ඡායාරූප 05 ක්
- රු. 15 ක් වටිනා මුද්දර
- උප්පැන්න සහතිකය මුල් පිටපත හා ඡායා පිටපතක්
- රු. 35ක මුද්දර ඇලවූ ලියුම් කවරයක් (සාමාන්‍ය සේවය සඳහා පමණක්)
- A4 ප්‍රමාණයේ ලියුම් කවර 2ක් (එක් දින සේවය සඳහා පමණක්)
- විවාහක කාන්තාවක්, තම ස්වාමි පුරුෂයාගේ නම ඇතුළත් කිරීම සඳහා ඉල්ලා සිටී නම විවාහ සහතිකයේ මුල් පිටපත හා එහි ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතුය.
- නම රැකියාව හැඳුනුම්පතේ සඳහන් කිරීම අවශ්‍ය වන්නේ නම රට අදාළ සේවා සහතිකය (මාස 03 ක් ඇතුළත ලබා ගත්)

කොස් ගස්,දෙල් ගස්,තල් ගස් කැපීම සඳහා බලපත්‍ර ලබා ගැනීමට අවශ්‍ය ලියකියවිලි.

- ඉල්ලුම් පත්‍රය
- ග්‍රාම නිලධාරිතුමාගේ නිර්දේශය
- ඉඩමේ ඔප්පුව
- ඉඩමේ සැලැස්ම
- ගෙයි හා වෙනත් ගොඩනැගිලි පිළිබඳ සැලැස්ම
- වෙනත් අය සමඟ සම්බන්ධ ඉඩමක් නම් අනිත් හවුල් කරුවන්ගේ කැමැත්ත ග්‍රාම නිලධාරී විසින් සහතික කරන ලිපිය
- උසාවියෙන් දෙන ලද නීන්දුවක් ඇත්නම් ඒ ලියකියවිලි
- ප්‍රාදේශීය සභාව මගින් දෙන නීන්දුවක් ඇත්නම් ඒ ලියකියවිලි

ආදායම් සහතිකයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය කරන ලියවිලි.

- සාමාන්‍ය විනිසුරුගෙන් ප්‍රකාශනයක් ලබා ගැනීම
- ග්‍රාම නිලධාරී සහතිකය
- ආදායම් සහතික කිරීමේ ලිපිය
  උදා(ව්‍යාපාර ලියාපදිංචිකිරීමේ සහතිකය , ණය ගිවිසුම)

දැව ප්‍රවාහනය සඳහා බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය කරන ලියකියවිලි.

- බලපත්‍ර ඉල්ලීමේ ඉල්ලුම්පත
- දැව ලබාගත් ඔප්පුවේ/ප්‍රදාන ඔප්පුවේ/බලපත්‍රයේ අනුමත කරන ලද කොපියක්
- දැව ලබාගනු ලබන ඉඩම රජයේ නොවෙනු ඉඩමකට/රක්ෂිතයකට
- මාධ්‍යමයේ නම් ඉඩමේ මිනින්දෝරු රේඛා සැලැස්මෙහි මුල් පිටපත
- දැව ලබා ගන්නේ වෙන්දේසියකින් නම් එම කුවිතාන්සිය
- දැව මිලයට ගනු ලැබුයේ නම් ග්‍රාම නිලධාරී විසින් සහතික කරන ලද කුවිතාන්සිය
- පරිත්‍යාගයක් වශයෙන් ලැබුනු දැව නම් ඒ පිළිබඳව ග්‍රාම නිලධාරී විසින් සහතික කරන ලද ලිපිය.
- දැව කැපීම සඳහා ලබාගත් බලපත්‍රය

ඔබටත් ප්‍රාණ ඉඩහසර....

වරකාපොල කොට්ඨාසයේ ඔබෙත් දරුවන්ගෙත් නිර්මාණශීලි හැකියාවන්ට අවස්ථාව ලබාදීමට අප සුදානම්.
ප්‍රාණ ත්‍රෛමාසික සඟරාවේ ලබන කලාපයට ඔබේ නිර්මාණ praanamagazine@gmail.com හෝ
0706368628 දුරකතන අංකයට Whatsapp කරන්න.
ඔබේ අදහස්,යෝජනා ,ගැටළු ද අපට යොමු කරන්න..
මේ ඉඩහසර ඒ සඳහාමය.

-සංස්කාරක-

පොඩ්ඩන්ගේ රූ රටා

කේ.එම්.අශ්විනි නිහිංසා
ඔක්ස්ෆර්ඩ් පෙර පාසල

බිනුකි සිහංසා විජේරත්න
8 වසර
කැ/තෝලංගමුව මධ්‍ය විද්‍යාලය

කේ.එම්. හිරුදිනි දිනේත්‍රා
3 වසර
කැ/දදිගම ප්‍රාථමික

සෙතුනි සතුල්‍යා විජේරත්න
වයස අවුරුදු 4 යි

බිනුකි සිහංසා විජේරත්න
8 වසර
කැ/තෝලංගමුව මධ්‍ය මහා විද්‍යාලය

ලිතුමි ජයෝද්‍යා විජේරත්න
6 වසර
කැ/අල්ගම ම.ම.වි.

එච්.ඒ.දසුනි තීක්ෂණා
කැ/වර/අල්ගම නව
ආදර්ශ ප්‍රාථමික විද්‍යාලය

එම්.ආර්. සහ්ලා
7 වසර
කැ/ නාංගල්ල ම.ම.වි.

වී .කේ. අමීෂ මිලාන්
10 වසර
කැ/වර/අඹේපුස්ස ම.ම.වි.

එස්.එම්. නිලසි සෙතුල්‍යා සේනාරත්න
3 වසර
කැඟලූ බාලිකා විද්‍යාලය

බී.එල්. සහේලී යශෝධරා බාලසූරිය
බ්‍රයිට් හොරිසන් පෙර පාසල
(පොල්ගහවෙල)



ලිතුමි ජයෝද්‍යා විජේරත්න
6 වසර
කැ/අල්ගම ම.ම.වි.

AI මෙවලම් සහ අනාගතය

මානව බුද්ධිය විසින් අවශ්‍යවන බොහෝ කාර්යයන් සරල කරගතහැකි බුද්ධිමත් යන්ත්‍ර සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීමේ ප්‍රතිපලයක් ලෙස AI තාක්ෂණය අදවනවිට අප අභිමුවට පැමිණ තිබේ.(කෘතිම බුද්ධිය Artificial intelligence) මෙය සරලව කියතොත් පරිගණක පුස්තකාලයක පද්ධතියකි. AI පද්ධති නිර්මාණය කර ඇත්තේ මිනිසුන්ගේ අවශ්‍යතා වටහා ගැනීමට, තර්ක කිරීමට සහ දත්ත වලින් ඉගෙන ගැනීමට, ලබාදෙන දත්ත විශ්ලේෂණයට ලක්කර නිවැරදිම ප්‍රතිපලය ලබාගැනීමට සහ නිශ්චිත ඉලක්ක සපුරා ගැනීම සඳහා තීරණ ගැනීමට හෝ ක්‍රියා කිරීමට ය.

කෘත්‍රිම බුද්ධිය විවිධ කර්මාන්තවල විප්ලවීය වෙනසක් ඇති කරමින් අප ජීවත් වන හා වැඩ කරන ආකාරය ප්‍රතිනිර්මාණය කරමින් පරිවර්තනීය බලවේගයක් ලෙස වේගයෙන් මතු වී ඇත. මෙම මෙවලම් සහ තාක්ෂණයන් අනාගතය ගැබ්බරු ආකාරයෙන් හැඩගස්වා ගැනීමට විශාල පිටුවහලකි. ස්වයංක්‍රියකරණය සහ දත්ත විශ්ලේෂණයේ සිට පුද්ගලාරෝපිත අත්දැකීම් සහ නව්‍ය ගැටළු විසඳීම දක්වා, නවෝත්පාදනයන් මෙහෙයවීමට සහ අපගේ සමාජයේ බහුවිධ අංග පරිවර්තනය කිරීමේදී ප්‍රධාන භූමිකාවක් ඉටු කිරීමට සකසා ඇත.

AI මෙවලම් සඳහා උදාහරණ

- Chat Gpt4
- Midjurney
- Leonado AI

AIහි අනාගතය පවතින්නේ මානව හැකියාවන් ප්‍රතිස්ථාපනය කිරීමේදී නොව ඒවා වැඩි දියුණු කිරීම තුළය. AI මෙවලම්වලට සංකීර්ණ ගැටළු විසඳීමට සහාය වීම, තීරණ ගැනීමේ ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සහ ඒ සම්බන්ද ශ්‍රම බලකායේ දැනුම පෝෂණය කිරීම මගින් මානව විශේෂඥතාව සම්පූර්ණ කළ හැකිය. AI සහ මිනිසුන් අතර මෙම සහජීවන සම්බන්ධතාව **නිර්මාණකරණය, උපදේශනය සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපනයේ සිට විද්‍යාත්මක පර්යේෂණ සහ පාලනය**වැනි විවිධ මාවත් හරහා නවෝත්පාදන සහ විශිෂ්ට සොයාගැනීම් සඳහා නව අවස්ථා කරා ගෙනයනු ඇත. AI මෙවලම් දැනටමත් විශාල කාර්යය ප්‍රමාණයක් ස්වයංක්‍රිය කිරීමට හැකියාව පෙන්නුම් කර ඇති අතර, මේ ඔස්සේ වඩාත් නිර්මාණාත්මක හා සංකීර්ණ ක්‍රියාවලීන් කාර්යක්ෂමව සිදුකරගැනීමට හැකියාව සැලසී ඇත. අනාගතයේ දී, AI හරහා තවදුරටත් ස්වයංක්‍රියකරණයට තුඩු දෙන හේතු සාධකයක්වනු ඇත. කාර්යක්ෂමතාව, ඵලදායිතාව සහ සම්පත් ප්‍රශස්තකරණය වැඩි කිරීමට ද මෙතුලින් හැකියාව සැලසේ. මෙම පරිවර්තනය සඳහා රැකියා භූමිකාවන් නැවත ඇගයීමක් අවශ්‍ය වන අතර AI තාක්ෂණයෙන් කටයුතු කිරීමට අවශ්‍ය කුසලතාවලින්හෙබි ශ්‍රම බලකායක් නිර්මාණය කිරීමේ වැඩසටහන් අවශ්‍ය වේ. AI තාක්ෂණයන් වගකීමෙන් භාවිතා කිරීමෙන්, වඩාත් කාර්යක්ෂම සහ තිරසාර සමාජයකට මග පෙන්වන, AI හි බලය මානව දක්ෂතාව සමඟ ඒකාබද්ධ කරන අනාගතයක් අපට නිර්මාණය කළ හැකිය.

යසින්ත ප්‍රදීප්මාල්
සංවර්ධන නිලධාරී - කුඹිල්ගම

ai tool භාවිත කරමින් කළ නිර්මාණ කිහිපයක්

හිලධාරීන්ගේ සැඟවුණු කලා උත්සහා එළිදැකුට

පැහැසර අහිමන් 2023

වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සියලුම අංශවල නිලධාරීන්ගේ කලා පෙළහැර "පැහැසර අහිමන් 2023" දෙවැනි වරටත් පසුගියදා තුල්හිරිය මාස් හෝල්ඩින්ග්ස්හි ඇතිනා ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. ඒ සුන්දර සැන්දෑ හෝරාව සහෝදර නිලධාරීන්ගේ විචිත්‍රවත් කලාංග රාශියකින් සුසැදි විය. මධුර හඬින් දෙකන් පින වූ මිහිරි ගීත ගායනා, ප්‍රේක්ෂක හදවත් අමන්දානන්දනයට පත් කළ මනෝහර නර්තනයන්, අර්ථවත් කෙටි නාට්‍ය රැසකින් එදින චේදිකාව වර්ණවත් විය. රාජකාරී කාර්යබහුලත්වයෙන් මිදී ලද විරාමයේදී නිලධාරීන්ගේ මානසික සුවතාවය හා රසඥතාවය ඉහළ නැංවීම මෙන්ම අන්‍යෝන්‍යතා සුහදතාවය වර්ධනය කරමින් මහජන හිතෙෂී රාජ්‍ය සේවයක් ස්ථාපනය කිරීමේ බලාපොරොත්තුවෙන් මෙය සංවිධානය විය.

ප්‍රහේලිකා අංක 01



හරහට
1 අතීතයේ ප්‍රෞඩත්වය විඳිබඳව කරන කනගාහ
5 ධනය රැස්කරන මාධ්‍යයකි
6 අතීතයේ පාලකයන් විසූවේ මෙහිය
8 මගේ සිත
9 දේශපාලන සිවිරිගෙයකි
10 අහරට ගන්නා ශාක කොටසකි
12 මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සභාවකි
16 ආන්දෝලනාත්මක දේශපාලන පක්ෂයක ලාංඡනයයි
17 වාසනාව
18 සැරිසරන

පහළට
1 ලෝපනල ගෞරවනීය නායිකාවකි
2 සමහරු නවමත් මෙහි වාසය කරති
3 මීනිස් සිත
4 යකුන්ට එරෙහි සටනට ගන්නා අවියකි
7 එක්නරා ගම්බද සාකච්ඡා සංගමයකි
8 මද වැසි සහිත කාලගුණය
10 බොකෝ දෙනා වෙහෙස වන්නේ මෙවා මකාගැනීමටය
11 සාහිත්‍යකරනයේ දී නම්‍යවත දෝෂයකි
13 සමහර දේශපාලකයන් ගේ මුව මිට උපමා කෙරේ
14 උදාහිරු
15 අපාය මෙලෙස ද නැඳින්වේ

ප්‍රහේලිකාව පුරවා එහි ඡායාරූපයක් 0776057275යන අංකයට **whatsapp** කරන්න
නිවැරදිව ප්‍රහේලිකාව පුරවා එවන පළමු තිදෙනාට විශේෂ තිලිණයන් ලබාදෙනු ලැබෙයි

කිනිවිට විහාරයේ පොසොන් කුඩු එල්ලීම
ළමා සමාජය - කිනිවිට

පොසොන්කුඩු සැරසිලි
යොවන සමාජය,ළමා සමාජය හා ගම්වාසීන් -
හල්ලව

පොසොන් කුඩු නරඹය සහ බෝදිපූජාමයෙදීකම
පෙරපාසලෙ ළමුන් හා ළමා සමාජය -
පුහුලේගම

කොත්තලේලි දන්සල - ළිඳු සහුර ළමා සමාජය
හේදු පෙරහැර, මෙත්තා නිවාරණී වැඩසටහන සිවි
මිසිදු ළමා සමාජය - ගොඩවෙල

පහන් කුඩුව
සමගි ළමා සමාජය - තඹදිය

සිල් සමාදන් වූ අය සඳහා කොත්තලේලි ලබා
දීම රහි කැකුළු ළමා සමාජය-
බෝපිටිය

පහන් කුඩු නිර්මානය
තිසර ළමා සමාජය - ඉහල ලෙනගල

පොසොන් තොරණ සහ බත් දන්සල
ක්‍රීඩා සමජය සහ ප්‍රදේශවාසීන් -
වෙනිවැල්ලකඩුව

පොසොන් පෙරහැර
ළමා සමාජය සහ වැඩිහිටියන් - පල්ලෙපැල්පිට

සිසිල් බීම දන්සල සහ පොසොන් කුඩුව
ගක්ති ළමා සමාජය- නාංගල්ල

පොසොන් කුඩු නරඹය
යොවන සමාජය,ළමා සමාජය හා ගම්වාසීන්
කන්දේගම

මල් දන්සල තෝලංගමුව බෝසත් ළමා සමාජය

බත් දන්සල
රන්සර යොවන සමාජය හා ගම්වාසීන්
කුඹිල්ගම

තිසර ළමා සමාජ සිසිල් බීම දන්සල
ඉහලලෙනගල

උඩරට වැනසූ යුද්ධයමුවේ මැණික්කඩවර බලකොටුව

තොරතුරු- මහාචාර්ය එම් කේ විරසිංහ
කැලණිය විශ්ව විද්‍යාලය

අතීතයේ පහතරට සිට උඩරට මාර්ගයේ පිහිටි මේ මැණික්කඩවර බලකොටුව කෑගල්ල දිස්ත්‍රික්කයට ආවේණික ඓතිහාසික වටිනා ස්මාරකයකි. මේ බලකොටුව පෘතුගීසි ආධිපත්‍යය ලංකාවේ තහවුරු කළ යුධමය අතින් ඉතා වැදගත් බලකොටුවකි මෙය ඉදිකරනු ලැබුවේ 1598 දී ජෙරනිමෝද අසවේදුගේ පාලන යුගයේය. මේ පෘතුගීසි බලකොටුව මැණික්කඩවර පුරාණ වැම්පිට විහාරයට ආසන්නයේ පිහිටා ඇති අතර අලව්ව, පිටගල්-දෙණිය, බිසෝවෙල, කන්නතොට හා බලන යන ස්ථානයන්හි ඇති පෘතුගීසි මුරපලවල් පාලනය කළ බව වාර්තා වේ.

අතීතයේ තිබූ අයුරු

වර්තමාන තත්වය

මේ වටා ගෙතුණු රසවත් මෙන්ම අනුවේදනීය කතා රැසකි. කන්ද උඩරට පාලකයා වූ පළමු විමලධර්මසූරිය රජුට පහර දීම සඳහා මෙම බලකොටුව මුලින්ම යොදා ගනු ලැබිණි. මේ බලකොටුව පෘතුගීසි හමුදා බැරැක්කවලට වඩා පෘතුගීසි සෙබළුන්ට යුධ පුහුණුව ලබා දුන් පාසලක් විය. ලංකාවේ සිටි පෘතුගීසි සෙබළුන්ගේ පුහුණුවීම් මධ්‍යස්ථානය විය. මෙය ඉදි කර ඇත්තේ දදිගම කොට වෙහෙර කඩා ගත් ගඩොලින් බව කියවේ. 1627 දී පළමුවන විමලධර්මසූරිය රජුගේ හමුදාව විසින් මේ බලකොටුව විනාශ කර ඇත.

මෙහි තිබී වෙඩි බෙහෙත් හා අවි ආයුධ විශාල ප්‍රමාණයක් හමු වී ඇති අතර බලකොටුවට නුදුරින් පිහිටි "වාඩියඹිට" නමින් දැනට හඳුනාගෙන ඇති ස්ථානයේ සෙබළුන් නේවාසිකව සිටි බව සැලකේ. කොටුවේ බස්නාහිර දෙස වන්නට "පල්ලියවත්ත" නමින් බිම්කඩක් දක්නට ඇත. මෙය පෘතුගීසි සෙබළුන්ගේ ආගමික කටයුතුවලට පල්ලියක් තිබී ඇත. උතුරු දෙසට වන්නට "ගෙරිවල" නම් ස්ථානයකි. එය ඔවුන්ගේ ආහාරය සඳහා ගවයන් මැරූ ස්ථානය ලෙස ජනප්‍රවාදයේ සඳහන්ය. පල්ලියවත්තට බටහිර දෙසින් "ශාලාවේ වත්ත" දක්නට ඇත. මෙය අධිකරණ ශාලාව පිහිටි ස්ථානය ලෙස සැලකේ. "ලේල්වල" නමින් කුඩා ජලාශයක් මැණික්කඩවර දක්නට ඇත. එය මැද විශාල ගල් කිහිපයකි. ඒ ගල නිදන් ගත නමින් හඳුන්වයි. එයට යාබද ගලේ කුරුස දෙකක් පැහැදිලිව කොටා ඇත. එම ස්ථානය පෘතුගීසි ස්නානය සඳහා යොදා ගන්නට ඇතැයි ගම්මුන්ගේ විශ්වාසයයි. එයට යාබදව "කඩු ගෑ ගල" නමින් සිහිවටනයකි. එහි එක් පැත්තක් ගෙවී ගොස් ඇත. පෘතුගීසීන් කඩු මුවහත් කිරීමට එය යොදා ගෙන තිබේ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් කළ කැණීම්වලදී කාල තුවක්කු හමු වී ඇති අතර 1642 සිටි පෘතුගීසි පාලකයා විසින් මේ බලකොටුව කඩා ඉවත් කර ඇති බව ද කියවේ.

සංස්කාරක

කේ. ඒ. එච්. එන්. කස්තුරිරත්න
ගිණුම් අංශය

ආර්.ඩී.එන්.පී.සෝමරත්න (සං.නි)
ඒබ්ඩිගල වසම

කිරිකැටි අතු

සින් නොනින් මෙඳ මෙනං
උසෙස් නුවල්
ජීවිතයේ අරුන්ඛවතම
කරයි නිහතිම බැඳ
වඳුලු ලබූ ජීවිතය
පරාජිතයන්ගු මෙන්
මුහුදින වනින
නොසිනේ සුමහල්
කිරිකැටි අතු
ජීවිතය දිනන නෙක්
දරාගමි සම්සිනන්
සියඹ දේ ඉවසමින්

නිසංසලා පතිරණ
මෙහෙයුම් අංශය

ඩලා ඉමි තවත් මං

තරවෙතුදු නොපෑයූ
අමාවක අඟස් ගබේ
දෙසම මා
බලා ඉමි
නිහඬ නේන හඬ රැන්න . . . .

සිම නාව කාරණා
හොඳකිමි ඉසිං මං
සිහිනයෙක දැවටිවත්
කුත්‍යයමේ මගේ ළොවට. . . . .

අද ඊයේ වාගේම
දැනුනාට තවම මට
දවස්. සති මහ ගොඩක්
ගෙවී නොස් මේ විතට . . . .

ගුරු පාර අද්දරින්
සිනහ පිටි කුඹුම් මුව
මෑවෙන තෙක් මග බලමි
උදාවන හමේ දිහක
සයනයේ නෙතු පියා
කුඹ එක්ක මුකුළු කර
හිඳිනු බෑ තවත් මට. . . .

ගසික මං දැවදි වී
ගුරු පාර අද්දරින්
යා යුතුයි පන්සලට
කුත් මගේ බණවරට කුඹේ
අරුත්‍යුම් කරුණකට. . . . .

අමානි තුවන්තිකා
ගිණුම් අංශය

කන්තෝරුව

දැන උගත් යැයි කියන
නිල දරුගේ අණ යටයි,
ප්‍රසිද්ධ යැයි කියන
ජන නියමුවාගේ හඬට
මු.රේ. ආයතන සංග්‍රහ,
චක්‍රලේඛ
එකී නොකී මෙකී නියම
පෙළයි,
උගත් වක් වූ
සේවක නිලදරු කැල
ගැලවී සම්මතයෙන් පිට
තනයි
නිදහස් ලොව එපිට
ව්‍යවසායකයන් වේ වුන්
අප හට

නිසංසලා පතිරණ
මෙහෙයුම් අංශය

වඩිනු බැහ බෙත් බුදුන්

අවලෝකිතේශ්වර,
අවලෝකිතේශ්වර...
ආසනුම්හෙ මා පවසනා..

එහතුරු ඔබ බලා සිටිනා..
ජනකායකි..නෙත් අඳුන් ගල්වා..

කට ඇතාගෙන සිමෑයි වෙහෙසව
අනුදින්යේ බිඩිදෙස බලා..
එකම හොඳුරට වාසනාවී කී
දිනු ක්‍රමණක් දැකිවිනා..

"වෙන් වෙන් වෙන්"

තවද පවසයි කාරණා..
උවට නෑසුණිද උගෙ වේදනා..

සියායෙනුයේ ...අවලෝකිතේශ්වර?

පිළිතුරක් ඇති - ප්‍රශ්නයක් ඇති
වියේ තේරෙන තෙනෙක පසුවිය..
විරහාලිවියිය සෙයක් හඟවෙන
සිතක උරුමවී මඳ දකක් කළෙ

බලා සිටිනා නෙත අඳුන් සෙත
පමණා මුදවාපං දකක් කළෙ..

එක්කො නවසිමි - තවද පවසමි

අත්ත ඇසිලෙස බලා වේහෙසෙනු
එයට ඇති දෙස්දෙවොල් පටිවනු
පලක් නෙත ගුණා දොස් විචාරනු
අවිත් විමසා දකක් මුදවනු
අවලෝකිතේශ්වර....

තවද පවසමි - එක්කොසු සුවසිමි
නවසි පතුවෙමි - "පවස" නවතමි

යසින්ත ප්‍රදීප්මාල්
කුඹල්ගම වසම

චිරභවක අරුන

කොළ දමා අතු දමා
විහිදුවා අහස් කුස
මල් විලින් වීල දා
වසන් කළ පැමිණි කළ
හිනැහුණි උහාරුවට

වීහගත් සමිනලුන්
අතු අහර හැඟුම් දුනි
මත මත්ව
මිහිපත්ව
දිසි හරින්
කාලය වියැකිලා
අතු කොළ ගිලිහිලා
මල් විලද නොම දා
වීහගත් ඉගිලිලා
හෝ බිරිහ නැකිලුණි
නැත්දමා ගියදා
වසන් කළ

එම්.තේ. බණ්ඩාර
ඉඩම් අංශය

ලොකු දෙල්ලේ
ලොකු දෙල්ලේ මගේ
නන්දා ජෝටියා මගේ
තුරුනලෙන් දෙවු මදුරේ
නිහඬ සිහියම නැගේ
නරු දිවලෙන රාහුගේ
තරුලෙන්නම හැංගුනේ
සුංචි දෙල්ලියේ මගේ
ආදරෙන් දෙව් අතේ
නරුණ නෙළුම් අතේ
දිනෙන් දින වඩ වඩා
ඒ ගිසෙයි ආදරේ
මහ මෙරක් වඩ වඩා

සකුන්තලා රණසිංහ
ඉඩම් අංශය

බුදු දහමෙන් ආදරය දකිමු

බුදු දහම ජීවිතය කලකිරෙන දහමක් නොවේ. එහි කලාත්මක විත්දනයට කිසිදු බාධාවක් නොවේ. එය තරුණ තරුණියන්ට ආමන්ත්‍රණය කරන දහමකි. සිද්ධාර්ථ කුමාරයා බුදු වූයේ වසර 35 දීය. ඕහිඳු හිමියන් මෙරටට වැඩියේ අවුරුදු 26 දීය. ප්‍රේමයට සම්බන්ධ සංකල්ප කොතරම් බුදු දහමේ පවතීද? බෝසත් සිරිත ප්‍රේම කාව්‍යයකි. යසෝදරා දේවියගේ ප්‍රේමය සසර පුරා පැවතුණකි. රටක ජීවනාලය ක්‍රියාශීලි තරුණ පරපුරයි. ඔවුන්ගේ ජීවිතය නිවැරදි දිශාවකට යොමු වුවහොත් ඔවුන්ගෙන් රටට ලබා ගත හැකි මෙහෙය අපමණයි. තරුණ ශක්තිය සමාජ උන්නතිය උදෙසා යොදා ගනිමු. ආදරයට ආදරය කරන්න ඉඩ දෙමු. බුදු දහමෙන් ආදරය දකිමු. අපේ දරු මුණුබුරන්ට ජීවත්විය හැකි පරිසරයක් ගොඩ නැගීමට අපි ඇපකැප වෙමු.

පී. කරුණාතිලක(ග්‍රාම නිලධාරී)
83/සී මාහේන ජනපද වසම

කෙටි කතාව

වංකගිරිය

අවාගිරට ගමේ සෙළිහ හිරු අහස සමඟ රණ්ඩුවට ඇත්තේ තව පුංචි මොහොතකි. එයට කූ මිටි සමඟින් දෝ දුවස් එලිය ආ බිය අතක් නැත. කුරුල්ලන් අඳුරට සාප කරමින් පොරගිරට මුව ළා තදු සළුන්ට වීය. අම්මා බුදු පහන් පාලු ළඟ තවමත් තම දානව, නළලු සිප ගන්නට ඉඩ දෙන්නීය. අම්මා පවසන ගාථාවලින් ආළින්දයේ සිටින භාවන්නට ඇසුනේ ශ්‍රෝත් සවුළු ඉළිග් පෙරි ආ සඬ පමණි.

"තව මි යෙයි ශ්‍රාමිල පත්තු නොහර බුදු පහන පත්තු කරලා. දැන් ගේ පුරා මී කළුවරයි. අම්මාට පිස්සද මන්දා." සමඟ මී මුණුමඟින් භාවන්න මිදුලට පාද, සමා මඳ හිරුට මිස දෙවෙය. හිරු සිය අහස පුරා රතු සාසය විසිරී අත. අවාගිර, හිරුව නිදාගෙනය. ඇවත ආ පිට හැරී පොරගිරේ සඳ තනතන අදුරට දෙසම භාවන්න නොස අහලේවේය. සඳේ කැළඹී දහරා හෙළේ වඳින්නට සෙව් හෙළේ සුසුම් දහරා සඳ වෙත යවිවේය. යම්යක් ක්‍රියත්මට වුවත් , අදුරිව වස්තුවත් යැයි සිතමින් භාවන්න සඳ දෙසට පා එසෙව්වේය.

"වසන් පුතේ, තෙම බෙදුලා තියෙන්නේ, කාලා නිටින්කො."

අම්මා ආළින්දයට පිවිසෙන දොර පළුවහට තම ගඟේ බර දී කිරගෙන සිටියාය. සිංහල උළුවලින් වැසුණු පිහාය මසවා සිටින තෙතෙසි බැවින් - මිරිතෙමින් , සඳ අත් ගිසිටින් නොමැති සෙයින් මින තණු පොළොවට ම වෙව සොලා වසයෙව උර දී සිටිනු ඇසෙයි භාවන්නට සිතුණි.

"ඔං, මං එන්නම්."

තමා කීවේ තවමත් දොර දැක සිටින මව දුටු ඇසිල්ලෙනිය. භාවන්න තෙම ගමෙරයට පියවර මැන්නේය. හෝ තුළ තමන සෙම අඩියක් ම තැවන්නේ බොහෝ කඩාත් මව ගැනට දැනුණි. තෙම මෙසය මැද ළාම්පුව දැල්වෙන අතර භාවන්න පුටුවත් ඉවතට අදද ඉඳගන්නේය. අද තෙම තන්නට තරම් රාත්‍රියක් මතුට නෙත. තම තුසට නොව මවගේ මින සුසුත් හෝ පිරෙන පරිදි මත් පත මින අත ද, මුව ද සෙළෙව්වේය. වසුට පත පුරා පැතිර ගිය කළු අත් විස්තරයක් සෙන අත පුරාම උතුරමි තෙල්ය. තෙම අතවර සෙයින් ආළින්දයට පැමිණ නාන්සි පුටුවෙහ තම ගත දන්නේය. ආළින්දය පුරා ම අඳාරය. රිය නිවුනේ මින්සියේ සව තර අයි පොල් පොල් පහන් දෙක ඔසාවේනි. අම්මා පැමිණ සෙත්වූවි මින තමා අයි සෙත්වූවට අත වෙව නියාවෙන් තමා සමඟ ලොවන්නට සරහෙන බවව භාවන්නට තෙතුණි. වසා හදාවළට පන දුන් සෙයින් ඔහුගේ පසේ දුවිලි සර ආළින්දයට ඔයිමි ඊම තමාට විය. කෑමරයට ගොස් හොර විසා අඳෙට ගත දී අඳුර ට දැස් දුන්නේය. තින්ද තම තෙත සින්නක්කරයට ම ගන්නත් කුමන මොහොතේ දැයි ඔසුවෙන් තෙදෙනුණි.

"පුතේ, තංගිවරං. දැන් හොඳට ම එළිය වැටිලා. උඹ ඉස්සෝල්ලේ යන්න තැනේ!"

අම්මා මොර දෙක හඬට දැස විවර කළ භාවන්න දොරපලු දෙස බැලීයේය. අම්මා පොරගිරේන් ගමින් අරිමා අත. අම්මා උඩ පහන්ත් තිරි දොළුතු පොරේ. මුව සෝදා තෙත හෙට ආ පසු සුදානම් වන ගියාව දන් සෙයින් දෝ මෙව තිරි විදුරුවත් තෙත ආවාය.

"ඔන් පත සමදහනම් මෙය බීලා නිටින්කො....." කියමින් භාවන්න දෙස බලලුවාය.

"හොඳයි. යම් ....." කියා භාවන්න ගෙන යා පුතු පොත් සුදානම් කළේය. එතෙවා ම ඔහුගේ තෙත ගෙදුගේ තමා සරසවියට ගිය අතුත බුරුවු හෑ තව පදයකි.

"සරා සඳ නුඹ
දුතු සඟෙන්
දැවටෙන්න
පොර බඳන
අරණ්දනියයි මෙ"

"කොහ විහාරද?" ඒ කාලේ ළියපුවා හෙත නිකතෙනොට ඔට ම ඇසීවේයි. මං දැන් සරා සඳ අළුතෙන අවරයි. දැන් මෙයි සරා සඳ, සරා සඳ - අධ්‍යාපනය. ඒ වුනාට මම තාම ඉස්සෙල්ලා යනවා. දැන් කොහෙවත් අරාන්දනි කාරකා නැහැ."

කියමින් යම ළුවට අවශ්‍යා පහනය ගිනෙවත් තැවමින් පොත් තිනිය දකුණතට ගත්තේය.

"ඔන් ටික තාලා පළුයං. උඹ එනකොටත් සද්දනත වෙනවනේ." කියමින් අම්මා දොර තලුවට අත ගෙදුවාය.

"වෙ බඩගිනි නෑ. අරෙත් හිල් ඔන් කන්න බිහැ. මං යනවා." කියමින් මිදුලට පා තමා සවුළුල දෙසට පා එසෙව්වේය.

"එහෙනං මං සේත කොරන්වං. ඉරහලු වැටෙන්න කලියෙන් විහරන්."

කියමින් තමාට පිටු පා යන රුව දෙස බලා ළුවට දිව දුන්නාය.

"හම්....." කියමින් භාවන්න සඳුල්ලට එසා ශුභ ගස අසලින් නොගෙති සිටියේය.

කාලය ඉගිලූ නොදී හිරු සළු වැටෙයේය. හිරු අහස් තුස මැදියුන් තරමක් මෙනාට ගෙවී එකරහි වෙලාවක් තැයිය. භාවන්න හිරුගේ රැයේ තැරට හාප කරමින් ශුභ ගසෙන් මෙහා සඳුල්ල පැන්නේය. අම්මා බිම ඉඳගෙන මොතවාළේ තරහු ඔහුට දුරට ම පෙනුණි. භාවන්න ආ ගමන නොර තෑදේ තම කාමරට තුළිනි.

"අම්මේ, මොකද ඔය කරන්නේ....."

භාවන්න කාමරයේ ඔට ම ඇදුවේ ළුවින් නොව තදවසේ තැගුණු තුලුහඬ් එලියක් ළඟිනි.

"පැදුරක් වියකවා මං. උඹේ අඳට දාන්න." කීවේ කාමරය දෙසට නොව පසුට ම ළුව අයාගෙනය.

"දැන් අනවරයි. උඹ තාගෙන වෙරන්. මං විසලා කියාදේදං. ඔන් පත වහලා ඇති කතං."

කියා මව කීවේ තමාට නොම පසුරට ලයි භාවන්නට සිතුණි.

ළිඳ ළඟ තුළුස් ගස නිසා හෙමින දුලු ළමින් මාඅඹමින් ගිහිලු සැයි. භාවන්න ගෙ පුරාවට ම බදි නොසිතන්නට දිය වත් හොට හෙට හොස්, ඔන් පත තුස පිරි තුස ළුවට එන තුරු ඔන් පත තමාට හොට දියෙන් දාන ම සෝදා ගත්තේය.

භාවන්න ආළින්දයට පා තබනුවිය. අම්මා පෙගෙන්නවෙන් තැයිය. මිදුලු පුරා ම පාවිව සේන්දු වී අත. සාමාරයට ගොස් ජනෙල් කමුම තරා ආලෝකයට ඉඩ දුන්නේය. ඇඳට ඉහළින් ඇති වියන් රෙද්දේ සුදු පැහැය අඳ අනුතු ම වී ඇතැයි භාවන්නට සිතුණි.

අඳ මෙ ඔතු ඉඳ ගත්තේය. අතුත් පසුර වියා ඇත්තේ තුන්තත් රටාවෙන් පසුර ම පුරා ගෙතය. අතුත් පසුර මිටියි, අඳට තද, මෙමන්, ඔය අඳ හා ගත අතර පොර බදියි. අඳ පුරාම අතුතු ම වූ සිහිලුය් විහනය වන අතුරු භාවන්නගේ ගතට දැනුණි. තම සිත ජනෙල් කවුළුවෙන් පිටතට පත ආලෝකය බදා ගන්නා අතුරු ඔතු බදා සිටියේ ආතාවෙනි. තමා ඵලා සරසවියේ දී බිය කවිය තවමත් පතය බව භාවන්නට සිතුණි.

තමාගේ අඳේ පෙර සිතුණු පසුර දොර මුල්ලේන් වැටී පොළොව පුරා දිග හැරී අත. එහි අයි වියන්හිර රටාව දෙස අවශ්‍යාවෙන් බලා භාවන්න සිතාවත් වා තළුයට විසිරුණේය. වියන්හිරිය තවමත් තමා දෙස බලා සිටියැයි හැගුට සිතුණි. එහෙත් ඔහුගේ තෙතේ සතුම් දහරා වියන්හිරියට නොව කවුළුවෙන් පෙරී එන ආලෝකයට මුව අයාගෙන සිටියේය.

- රසිත කරුණාසේන -

ප්‍රාණ ත්‍රෛමාසික අන්තර්ජාල සඟරාව
වරකාපොල ප්‍රදේශය ලේකම් කාර්යාලය
වරකාපොල
praanamagazine@gmail.com

උපදේශකත්වය
වරකාපොල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලීය ප්‍රාදේශීය ලේකම්
රංගන සජීව
වරකාපොල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලීය සහකාර ප්‍රාදේශීය ලේකම්
කෞෂල්‍යා බණ්ඩාර

සංස්කාරක
චලානි ධිවන්ති හේරත් (සංවර්ධන නිලධාරී) 0776057275

සම්බන්ධීකරණ සහය
දනේශි ජයතිලක (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර)
නිසංසලා පතිරණ (සංවර්ධන නිලධාරී)
ශාන්ත පුෂ්පකුමාර (සංවර්ධන නිලධාරී)

පරිගණක අක්ෂර හා පිටු සැකසුම්
යසින්ත ප්‍රදීප්මාල් (සංවර්ධන නිලධාරී) 0712637846